ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

වාර්ෂික වාර්තාව

2020

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

එම්.ඩී.එච්. ජයවර්ධන මාවත

අතුරුගිරිය

දුරකථනය - 011-2770232

විද්‍යුත් තැපෑල - nipm1979@gmail.com

වෙබ් - www.nipm.gov.lk

DO/ACC/01

පටුන	පිටු අංකය
දැක්ම හා මෙහෙවර ප්‍රකාශය	2
සභාපතිතුමාගේ පණිවිඩය	3
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ විශ්ලේෂණය	4 - 7
සංස්ථාපනය, අරමුණු, පරමාර්ථ සහ බලතල	8 - 10
පාලක මණ්ඩලයේ විෂය පථය සහ සංයුතිය	10 - 11
විගණන හා කළමනාකරණ කමිටුවේ විෂය පථය සහ සංයුතිය	12 - 13
ආයතනයේ කාර්ය මණ්ඩලය	13 - 17
ආයතනයේ පරිපාලන අංශය පිළිබඳ සමාලෝචනය	18
සංවිධානය ව්‍යුහය	19
ආයතනයේ පුහුණු අංශය පිළිබඳ සමාලෝචනය	20 - 21
පුහුණු වැඩසටහන්වල ප්‍රගති සමාලෝචනය	22 - 33
වෘත්තීය සාමාජිකත්වය	34
ආයතනය සපයන පහසුකම්	34 - 37
අපගේ ක්‍රියාකාරකම්	38
මූල්‍ය සමාලෝචනය	39 - 43
ආයතනය මුහුණු දුන් සංරෝධක	43
නිගමනය	44

දැක්ම

වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව හා උපදේශන සැපයීම සහ සමීක්ෂණ පැවැත්වීමේ විශිෂ්ට ආයතනය බවට පත්වීම.

මෙහෙවර

ගුණාත්මක පුහුණුව තුළින් වැවිලි කර්මාන්තයේ සියලුම මානව වත්කම්හි වෘත්තීය නිපුණතාව පරිපූර්ණත්වය දෙසට ඉහළ නැංවීම

සභාපතිතුමාගේ පණිවිඩය



ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ **2020** වාර්ෂික වාර්තාව වෙනුවෙන් එහි වර්තමාන සභාපතිවරයා ලෙස පණිවිඩයක් නිකුත් කරනු ලබන්නේ හද පිරි සතුටිනි.

ඕනෑම සංවිධානයක අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ සම්පත්වලින් සමන්විත වීම ඉතා වැදගත් වේ. මෙම විවිධ සම්පත් අතර ඇති එකම ජීවී සම්පත මානව සම්පත වන අතර සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා මානව සම්පත ඉතා වැදගත් වේ. එයට හේතුව අනෙකුත් සියලුම සම්පත් සමූහය මෙහෙයවනු ලබන්නේ මානව සම්පත විසින් වන බැවිනි. එබැවින් මානව සම්පත සංවර්ධනය කිරීම ආයතනයකට ඉතා වැදගත් වේ. පුළුල් අර්ථයකින් ගත් කළ දැනුම හුවමාරු කර ගැනීම, නිපුණතා වැඩි දියුණු කිරීම සහ ධනාත්මකව සිතීමේ ක්‍රමවේදයන් ප්‍රගුණ කිරීමට මහ පෙන්වීම මානව සම්පත් සංවර්ධනයේ දී සිදු කරනු ලැබේ.

2020 වර්ෂය දෙස ආපසු හැරී බලන විට, වැවිලි කර්මාන්තය අභියෝග රැසකට මුහුණ දුන් වර්ෂයක් ලෙස සැලකිය හැකි ය. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම, ශ්‍රම ආකර්ෂණය නොමැතිකම හා කොවිඩ් - **19** වසංගත තත්ත්වය හේතුවෙන් ලොව ආර්ථිකයට සිදු වූ බලපෑම වැවිලි කර්මාන්තය මුහුණ දුන් අභියෝග අතර ප්‍රධාන වේ. ඉහත සඳහන් අභියෝග ජය ගැනීම උදෙසා වැවිලි ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය පිණිස විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීමේ වගකීම අපි භාර ගත්තෙමු. එහි ප්‍රගතිය සම්බන්ධයෙන් මෙම කාර්ය සාධන වාර්තාව සාක්ෂි දරනු ඇත.

ආයතනය ඉහළ කාර්ය සාධන මට්ටමකට ගෙන ඒමට මහ පෙන්වූ ගරු වැවිලි අමාත්‍ය, වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා ද, සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා, තේ හා රබර් කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය, කනක හේරත් මැතිතුමා ද වැවිලි අමාත්‍යාංශ ලේකම්, රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා ද සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා, තේ හා රබර් කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්, ජේ.එම්. තිලකරත්න බණ්ඩා මහතා ද වැවිලි අමාත්‍යාංශයේ සහ වැවිලි රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සියලුදෙනාම ද මේ අවස්ථාවේ දී ගෞරව පූර්වකව සිහිපත් කරමි.

ආයතනයේ පාලක මණ්ඩලය සහ ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි, ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය විසින් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තම වෙහෙස මහන්සිය නොබලා දක්වනු ලැබූ දායකත්වය වෙනුවෙන් ද මාගේ ස්තුතිය පළ කර සිටිමි.

ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන
සභාපති
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

2021.03.26

අධ්‍යක්ෂගේ සමාලෝචනය



ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ 2020 අධ්‍යයන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව නිකුත් කිරීම පිළිබඳ සතුටු වන අතර, කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුව ද අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම්, ජයග්‍රහණ, මුලපිරීම් සහ නව සාමාන්‍ය තත්ත්වය සමඟ ආයතනයේ අනාගත සැලසුම් පිළිබඳ විශේෂ අවස්ථා ඔබ සමඟ බෙදා ගැනීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙමි.

පසුගිය වසර කිහිපය තුළ විශේෂයෙන්ම 2017 සිට ක්‍රමිකව අප ශක්තිමත් අධ්‍යාපන සංස්කෘතියක් ගොඩනඟා ගෙන ඇති අතර, විවිධ අධ්‍යයන වාර්තා තුළින් පිළිඹිබු කරන සංඛ්‍යාලේඛන මඟින් ඒ බව තහවුරු කරනු ලබයි. අපගේ පාඨමාලා සම්බන්ධයෙන් පවතින වෘත්තීයමය පිළිගැනීම අපි අඛණ්ඩව වැඩිදියුණු කිරීමට කටයුතු කළ අතර අපගේ පාඨමාලාවන් හදාරන ලද ශිෂ්‍යයන් මඟින් මෙම ප්‍රකාශය තහවුරු කරනු ලබයි. මෙහි දී අපගේ ප්‍රමුඛ අරමුණක් වන්නේ වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රගතිය සඳහා ප්‍රමාණවත් දක්ෂතාවන්ගෙන් නිපුණතාවන්ගෙන් පිරි මානව සම්පතක් ගොඩනැංවීමයි. මේ සම්බන්ධයෙන් පසුගිය පස් වසරක කාල පරිච්ඡේදය තුළ අප විසින් සැළකිය යුතු ප්‍රගතියක් සාක්ෂාත් කරගෙන ඇත.

පසුගිය මූල්‍ය වර්ෂය අවසානය වන විට COVID-19 වසංගතය හේතුවෙන් මානව වර්ගයාට සුවිශේෂී අභියෝග රැසකට මුහුණ දීමට සිදු විය.

වත්මන් ක්‍රියාකාරකම් මෙන්ම අනාගත සැලසුම් සියල්ල සම්බන්ධයෙන් පවතින අර්බුදය හමුවේ වුව ද අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය කරන විසඳුම් ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. එමෙන්ම සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවේදය මඟ හැර නැවුම් වූ මංපෙතක් සොයා ගැනීමට පවත්නා වසංගත තත්ත්වය අප පොළඹවනු ඇත.

අධ්‍යයන ජයග්‍රහණ

ඔබ සැවොම දන්නා පරිදි, කොවිඩ් - 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුව ද, 2020 වර්ෂය තුළ අධ්‍යයන, පර්යේෂණ, පරිපාලන සහ යටිතල පහසුකම් ආවරණය වන පරිදි නව මුල පිරීම් රාශියක් ආයතනය විසින් සිදු කර ඇත. සිදු කරන ලද මෙම සියලු මුල පිරීම් අද වන විට ආකර්ෂණීය ප්‍රගතියක් ලබා ඇත. අපගේ කාර්යක්ෂම කාර්ය මණ්ඩලයේ හා කුසලතාවන්ගෙන් සපිරුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන් වැවිලි ක්ෂේත්‍රය තුළ පෙන්වනු ලබන ප්‍රගතිය ආයතනයට එක් කරනුයේ ඉමහත් කීර්තියකි. වැවිලි ක්ෂේත්‍රය තුළ ආයතනයේ පිළිගැනීම ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ දායකත්වය මෙන්ම දක්ෂතා හා හැකියාවන්ගෙන් සපිරුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය ද ඉමහත් බලපෑමක් ඇති කර තිබේ. එමෙන්ම ආයතනයේ ප්‍රගතිය උදෙසා වෘත්තීය සාමාජිකයන්ගේ මෙන්ම කාර්ය මණ්ඩලයේ දායකත්වය ද ඉමහත් සේවයක් ඉටු කර ඇත.

ISO ප්‍රමිතීන්ට අනුකූල වෙමින් 2020 අධ්‍යයන වර්ෂය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 5-6 පදනම් වූ අධ්‍යාපන ක්‍රමය හරහා වැවිලි බෝග තාක්ෂණය සහ වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා දෙකක් ආරම්භ කර ඇත.

NIPM හි සාමූහික දැක්ම වන්නේ ඉහළ නවීන අධ්‍යාපනික ක්‍රමවේදයන් භාවිත කිරීම හරහා දැනුම දියුණු කිරීම සහ තාක්ෂණිකව දක්ෂ සහ සමාජ සවිඥානික වෘත්තිකයන් බිහි කිරීම සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහ නවෝත්පාදන මත පදනම් වූ ව්‍යවසායකත්වය

උත්ප්‍රේරණය කිරීම මගින් රටේ ප්‍රමුඛ පෙළේ වෘත්තීය ආයතනයක් වීමයි. මෙම අරමුණින් යුතුවම නවීන යන්ත්‍රෝපකරණ හා තාක්ෂණය භාවිත කරගත් තේ කර්මාන්ත ශාලාවක්, තේ රස බැලීමේ රසායනාගාරයක් (Tea Tasting Laboratory) NVQ පාඨක අධ්‍යාපන ක්‍රමය ඉලක්ක කරගනිමින් සාර්ථකව පවත්වාගෙන යාමට ද ආයතනය කටයුතු කර ඇත.

වෘත්තීය සාමාජිකත්වය ආයතනයේ තවත් ශක්තිමත් අංශයක් වන අතර එය වැවිලි ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා අති මහත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙස නව සාමාජිකත්ව කාණ්ඩයන් හඳුන්වා දීම සඳහා කලින් කලට අදාළ පනත සංශෝධනයට ද ආයතනය කටයුතු කරනු ඇත.

ආයතනය ස්වාධීන උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස සංවර්ධනය කිරීමට ආයතනය පියවර ගෙන ඇත. ඒ අනුව උපාධි පාඨමාලා 3 ක් සංවර්ධනය කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් සිදුකරමින් පවතී. ඒ අනුව, මහල් හයකින් යුතු පරිපාලන හා අධ්‍යයන ගොඩනැගිල්ලක් අතුරුගිරිය පරිශ්‍රයේ දැනටමත් ඉදිකරමින් සිටින බව පවසනුයේ ඉමහත් සතුටිනි.

ආයතනයේ කීර්ති නාමය

ප්‍රාදේශීය වැවිලි සමාගම්, කුඩා වතු හිමියන්, පර්යේෂණ ආයතන, රාජ්‍ය සහ පෞද්ගලික සමාගම් සහ රට පුරා සිටින අනෙකුත් පාර්ශ්වකරුවන් මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව සමඟ ආයතනයේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා ඉතා සමීප සබඳතාවන් පවත්වාගෙන යනු ලබයි.

වැවිලි ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන්ගේ ධාරිතාව වැඩිකරමින් ව්‍යවසායකයන් සවිබල ගැන්වීම සඳහා ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සාර්ථකව කර ගැනීම සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම් සමඟ සමීපව කටයුතු කරනු ලබයි. ඒ අනුව, 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය සහතික කිරීමේ වැඩසටහන ද ඇතුළත්ව 2020 වසර සඳහා ආදායම් උත්පාදක වැඩසටහන් 17 ක් සිදු කර ඇති අතර සිසුන් 453 ක් සඳහා පුහුණු දායකත්වය ලබා දී ඇත. කුඩා වතු හිමියන් ද ඇතුළත්ව සමස්තයක් ලෙස පුද්ගලයන් 1146 දෙනකු පුහුණු කිරීම සඳහා ආයතනය දායක වී ඇත.

2020 වසරේ NIPM ක්‍රියාකාරකම්වල විශේෂත්වයක් වූයේ, COVID 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුව ද විවිධ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ ප්‍රතිශතය 90% ක මට්ටමක පවත්වාගෙන යාමට හැකිවීමයි. ආයතනය අධ්‍යයන වැඩසටහන්වලින් රු. මිලියන 23.73 ක ආදායමක් උපයා ඇත. අධ්‍යයන වැඩසටහන් සඳහා සිසුන්ගේ ලියාපදිංචියේ ප්‍රගතිය ඇස්තමේන්තුගත සිසුන් සංඛ්‍යාවෙන් 62% ක් ලෙස වාර්තා වී ඇත. කුඩා වතු අංශය සඳහා 2020 වර්ෂයේ දී රු.මිලියන 2.5 ක් වෙන් කර තිබුණි. 2020 වසරේ දී NIPM වාර්තා කර ඇති සමස්ත ආදායම රු. මිලියන 45.95 ක් වන අතර එය අධ්‍යයන කටයුතු මගින් ලද ආදායමේ ප්‍රතිශතයක් ලෙස 59% ක ප්‍රගතියකි. රජයේ මුළු ප්‍රදානය රු. මිලියන 164.37 ක් වන අතර වත්කම් වටිනාකම 2020 මූල්‍ය වර්ෂය අවසානයේ දී රු. මිලියන 940.68 කි. ආයතනය ස්පෘශ්‍ය වත්කම් රු. මිලියන 41.99 ක් සහ අස්පෘශ්‍ය වත්කම් 2020 මුදල් වර්ෂය තුළ රු.මිලියන 0.24 කි.

ආයතනයේ පුහුණු පහසුකම් බාහිර ආයතන සඳහා සඳහා ලබා දීමේ ආදායම රු. මිලියන 6.36 ක් වූ අතර පුනරාවර්තන වියදම් ලෙස රු.මි. 113.53 වාර්තා විය. එය 2019 වර්ෂයට සාපේක්ෂව 18.1% ක අඩු වීමකි. පුනරාවර්තන වියදම් එලෙස අඩුවීමට හේතු වූයේ කොවිඩ් 19 ගෝලීය වසංගත හේතුවෙන් ප්‍රායෝගිකවම ආයතනය තුළ වැඩ කරන ලද පැය ගණන අඩුවීමයි. තව ද වියදම් ආයතනය විසින් මාර්ගගත ක්‍රමවේදය හරහා ආයතනය වැඩි

වශයෙන් ආයතනික කටයුතු සිදුකිරීමට කටයුතු කර ඇත.

ගෝලීය වසංගතය තත්ත්වයේ බලපෑම

ගෝලීය වසංගත තත්ත්වය ආයතනය වෙත යම් අහිතකර තත්ත්වයක් ඇති කරනු ලැබූ නමුත් කළමනාකරණය කිරීම තුළින් අනාගත අර්බුද සඳහා සාර්ථකව මුහුණ දීමට කටයුතු කළ යුතු ය. එම අරමුණින් යුතුව ආයතනය අනාගත අධ්‍යාපනික වැඩසටහන් තවදුරටත් සංවර්ධනය කිරීම සිදු කළ යුතු ය. මෙහි දී අධ්‍යයන අංශයේ සූදානම ඉතා වැදගත් ය. විශේෂයෙන්ම මාර්ගගත ක්‍රමවේදයන්ට අනුකූලව ඉගැන්වීම් කටයුතු කෙරෙහි අවදානය යොමු කිරීම වැදගත් වේ. මාර්ගගත ක්‍රමයන්ට අනුකූලව වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ඉගැන්වීම් මෙවලම් පිළිබඳව අධ්‍යයන අංශයට හොඳ අවබෝධයක් ලබා දීම වැදගත් ය. එමගින් අනාගතයේ දී ඇතිවිය හැකි වසංගත තත්ත්ව හෝ ස්වභාවික ආපදා තත්ත්වවලට මුහුණ දීමට අපට හැකි වනු ඇත.

නව තාක්ෂණික ක්‍රමවේද භාවිතය

වැවිලිකරුවන්, ගොවීන් සහ ව්‍යාප්ති ක්‍රියාකාරීන් වෙත නවතම තාක්ෂණය, දැනුම සහ අදාළ කුසලතා බෙදාහරිමින් දිවයිනේ සියලුම පර්යේෂණ ආයතන, පෞද්ගලික සහ රාජ්‍ය ආයතන සමඟින් **NIPM** සතුව ශක්තිමත් සහ ඵලදායී ව්‍යාප්ති සේවා ජාලයක් ඇත. එවැනි ක්‍රියාකාරකම් වැවිලි ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා අතිමහත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම ඒකක මඟින් තාක්ෂණයන් තක්සේරු කිරීම සහ ශෝධනය කිරීම, ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ ක්ෂේත්‍ර චාරිකා, දැනුවත් කිරීමේ වැඩසටහන්, ආදර්ශන, කණ්ඩායම් සාකච්ඡා සහ ක්ෂේත්‍ර දින සංවිධානය කිරීම වැනි වැදගත් කාර්යයන් ඉටු කරන ලදී. කාර්මික වර්ධනයන් පිළිබඳව වැවිලි ප්‍රජාව දැනුවත් කිරීම **NIPM** හි තීරණාත්මක සාධක විය.

පුහුණු අවස්ථා සැලසීම

ආයතනය මඟින් දිවයින පුරා විහිදී ඇති කාර්මික, තාක්ෂණික, කළමනාකරණ සහ පර්යේෂණ සංවිධාන සමඟ ක්‍රියාකාරීව කටයුතු කරනු ලබයි. එලෙස පුළුල් පරාසයක් තුළ විහිදී ගිය ආයතන සමඟ කටයුතු කිරීම තුළින් අප ප්‍රධාන වශයෙන් අරමුණු දෙකක් ඉටු කරගැනීමට බලාපොරොත්තු වේ. මූලිකවම සිසුන් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා නිපුණතාව වඩාත් ඵලදායී ලෙස ලබා දීමට කටයුතු කිරීමත් සහ දෙවනුව අදාළ ක්ෂේත්‍රයන්හි රැකියා අවස්ථා ලබා ගැනීමට සිසු සිසුවියන්ට අවස්ථාව උදා කරදීමත් ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපගේ සිසුන් රැනියා මට්ටම්වල විවිධ කාණ්ඩවල කර්මාන්තයේ සිටිති.

උපායමාර්ගික සංවර්ධන ඉලක්ක

2022 වන විට එම අංශයට සම්බන්ධ මානව සම්පත්වල කුසලතා සහ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් වැවිලි කර්මාන්තය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් **(NVQ)** සංවර්ධනය කිරීමේ උපාධි වැඩසටහන් දියත් කිරීමට **NIPM** උත්සාහ කළේ ය. ස්වාධීන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස අපගේ මීළඟ මධ්‍ය කාලීන සැලැස්ම තුළ ප්‍රමුඛත්වය දීමට ආයතනය විසින් කටයුතු කොට ඇත.

2019-2022 උපායමාර්ගික ඉලක්ක මඟින් ඉදිරි සිව් වසර තුළ සංවිධානයක් ලෙස අප අත් කරගත යුතු සාර්ථකත්වය පිළිබඳ දළ විශ්ලේෂණයක් දක්වා ඇත. මේවා:

• *උපායමාර්ගික ඉලක්ක 1 : අංශයට ගුණාත්මක සේවාවන් සැපයීම සඳහා ආයතනයේ අධ්‍යයන පීඨය ශක්තිමත් කිරීම සහ මානව සම්පත් සංවර්ධනය කිරීම*

• *උපායමාර්ගික ඉලක්ක 2: අලෙවිකරණය සහ ප්‍රචර්ධනය ශක්තිමත් කිරීම සඳහා අපගේ ප්‍රධාන ප්‍රවීණතා ක්ෂේත්‍රවල ඉහළ බලපෑමක් ඇති කරන*

අධ්‍යාපන විසඳුම් සමඟින් කැපී පෙනෙන ලෙස කීර්ති නාමය පුළුල් කිරීම

- *උපායමාර්ගික ඉලක්ක 3: තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) සහ ISO ප්‍රමිති සහිත යටිතල පහසුකම් සහ සශ්‍රීක පරිසරයක් සංවර්ධනය කිරීම.*

පැහැදිලිවම, ආයතනය තුළ පීඨයට, කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට මෙන්ම එහි සුභ පතන්නන්ට සහ පාර්ශ්වකරුවන්ට සැබවින්ම ආඩම්බර විය හැකි බොහෝ දේ සිදුවෙමින් පවතී. නමුත් ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ප්‍රගතිය සහ ප්‍රයෝජනය ප්‍රමාණවත් නොවේ. කෙසේ වෙතත්, අප දැනටමත් සිදු කරමින් සිටින දෑ දිගටම කරගෙන යන අතරම, නව අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමට අවශ්‍ය වේ:


1. දේශීය හා විදේශීය සිසුන් ආකර්ශණය කර ගත හැකි සහ ඉදිරි දශක කිහිපය තුළ විශිෂ්ට ශාස්ත්‍රීය කටයුතු සඳහා ඉවහල් වන පරිදි අංගසම්පූර්ණ නවීන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

2. තම අත්දැකීම් සමුදාය තුළින් ආයතනයට කීර්තියක් ගෙන දෙන විශිෂ්ටතම සහ ප්‍රායෝගික විද්වතුන් බඳවා ගැනීම.

3. වැවිලි කර්මාන්තය සඳහා උනන්දුවක් දක්වන නමුත් ඒ සඳහා මූල්‍ය ශක්‍යතාවක් නොමැති සිසුන්ට ශිෂ්‍යත්ව කිහිපයක් ප්‍රදානය කිරීම තුළින් විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය වීම. පරිත්‍යාගශීලී අරමුදල් රැස්කිරීමේ අපගේ ප්‍රයත්නයන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවිය යුතු ය.

4. ශාස්ත්‍රීය ලෝකය මෙන්ම කර්මාන්ත සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම. එක් අතකින්, අපි ලෝකයේ ඉහළම විශ්වවිද්‍යාල සමඟ හවුල්කරුවෙකු වීමට කැමැත්තෙමු, අනෙක් පැත්තෙන්, අපි ශ්‍රී ලංකාවේ හොඳම උපාධි අපේක්ෂක විද්‍යාල සම්බන්ධ කර ගැනීමට කැමැත්තෙමු.

ආයතනය වර්ධනය වන විට අභියෝග, නව්‍යකරණයට සහ ආයතනයට ලබා දුන් දායකත්වය මත රඳවා තබා ගැනීමට සහ වැඩි දියුණු කිරීමට නව ක්‍රම සහ විධික්‍රම සොයා ගත යුතු බවත් බලය ඇති බව හැඟෙන උද්යෝගිමත් පරිසරයක් පවත්වා ගැනීමටත් අවශ්‍ය බව සඳහන් කිරීමට මම සතුටු වෙමි. අවසාන වශයෙන්, ආයතනයට ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම ගරු වැවිලි අමාත්‍යතුමාගෙන් ලැබුණු අනුග්‍රහය සහ මඟ පෙන්වීම හේතුවෙනි. ගරු වැවිලි අමාත්‍යවරයාට සහ වැවිලි අමාත්‍යාංශයේ ලේකම්තුමාට ද , ගරු සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ සහ රබර් වතු ආශ්‍රිත බෝග වගාව, කර්මාන්තශාලා නවීකරණය සහ තේ සහ රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාට සහ එම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාට ද **2020** වසර සාර්ථක කර ගැනීම සඳහා ආයතනයේ සභාපතිතුමා සහ **NIPM** පවුලේ සාමාජිකයින් විශාල සහයෝගයක් ලබා දීම සම්බන්ධයෙන් විශේෂ ස්තුතිය පුද කර සිටිමි.



ආචාර්ය ප්‍රසාද් ධර්මසේන
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
2021.03.26

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

පරිපාලන වාර්තාව

සංස්ථාපනය හා අරමුණු



ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 අංක 45 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත කර ඇති අතර වඩාත් ඵලදායී හා ශක්තිමත් රාජ්‍ය ව්‍යස්ථාපිත ආයතනයක් ඇති කිරීම උදෙසා 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 දරණ පනත් මඟින් සංශෝධනයට ලක් කර ඇත. ආයතනයේ ප්‍රධාන කාර්යාලය එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය යන ලිපිනයේ ස්ථාපිතව පවත්වා ගෙන යනු ලැබේ.

මෙම පනතට අනුව, පුහුණු වැඩසටහන්/අධ්‍යයන පාඨමාලා සාර්ථකව නිම කරන අයට සහතික පත්‍ර නිකුත් කිරීමට සහ වැවිලි විධායක නිලධාරීන් සඳහා වෘත්තීය සාමාජිකත්වය ප්‍රධාන කාණ්ඩ 03 ක් යටතේ පිරිනැමීම සඳහා ස්ථාපිත රජයේ එකම ආයතනය ලෙස ජාතික වැවිලි කළමනාකරණ ආයතනය බල ගන්වා ඇත. කුඩා වතු හිමියන් ද ඇතුළුව වැවිලි ක්ෂේත්‍රයේ රැකියා නියුක්තිකයන්ගේ වෘත්තීය හැකියාවන් ඉහළ නිපුණතාවෙන් යුතුව පවත්වා ගෙන යාම මේ මඟින් සහතික වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධාකාරයේ සම්මන්ත්‍රණ, වැඩමුළු, විභාග පැවැත්වීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා පර්යේෂණ හා උපදේශන සේවා සැපයීම සිදු කරයි.

<u>පරමාර්ථ</u>

මෙම පනත සහ ඊට අදාල සංශෝධනයන්ට අනුව ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පොදු පරමාර්ථ පහත පරිදි වේ.

i. වැවිලි සේවයෙහි නියුක්ත සියලු කාණ්ඩයන්ට අයත් සේවා නියුක්තිකයන්ට ආයතනය විසින්ම හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි හෝ ඇති වෙනත් ආයතන සම්බන්ධව වැවිලි කළමනාකරණයට අදාළ පුහුණුවීමේ පහසුකම් සහ පුහුණු වීමේ පාඨමාලා සැපයීම.

ii. සේවයෙහි යෙදී සිටින සේවා නියුක්තිකයන්ට වැවිලි කළමනාකරණය පිළිබඳ සංස්කරණ සම්මේලන සහ තත්ත්වානුකූලකරණ පාඨමාලා සංවිධානය කිරීම.

iii. රාජ්‍ය අංශයෙහි මෙන්ම පෞද්ගලික අංශයෙහි වැවිලි සේවයේ නියුතු සේවක පිරිස් සඳහා වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව සැලසීම.

iv. තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, පොල් පර්යේෂණ ආයතනය හා එබඳු වෙනත් ආයතනයන් සමඟ සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලා සංවිධානය කිරීම සහ යෝග්‍ය අවස්ථාවල දී ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

v. වැවිලි කළමනාකරණය හා සංවර්ධනය සම්බන්ධ වූ සම්මන්ත්‍රණ හා කාර්යය සැසි සංවිධානය කිරීම හා පැවැත්වීම සහ සඟරා සහ කලාප පළ කිරීම.

vi. වෙනත් සමාන ආයතනවලින් දැනටමත් විධිවිධාන සලස්වා නොමැති, වැවිලි කළමනාකරණය සහ කම්කරු සම්බන්ධතා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

vii. වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය දක්ෂතාව ඇති තැනැත්තන්ට වැවිලි කර්මාන්තයේ මිනිස් බල අවශ්‍යතාවන් ගැන සැලකිළිමත්ව වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුව ලබා දීම.

viii. වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර යම් වෙනත් ආයතනයකට කළමනාකාරීත්ව, තාක්ෂණික සහ පරිපාලන උපදෙස් හා සේවා සැපයීම.

<u>ආයතනය සතු බලතල</u>

i. යම් චංචල හෝ නිශ්චල දේපලක් යම් ආකාරයකින් අත්කර ගැනීම සහ තබා ගැනීම, බද්දක් හෝ කුලියක් මත ගැනීම හෝ දීම හෝ උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

ii. වැවිලි පර්යේෂණවලට අදාළ ක්ෂේත්‍ර අභ්‍යාස මධ්‍යස්ථාන සහ නියමිත ව්‍යාපෘති අත් කර ගැනීම, පිහිටුවීම, ඉදිකිරීම් සහ ක්‍රියාත්මක කිරීම.

iii. ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ ආයතනයේ කාර්යක්ෂම පැවැත්ම සඳහා උපකරණ, අරමුදල්, පිරිස් සහ යම් වෙනත් ආධාර බාර ගැනීම.

iv. වැවිලි සංවර්ධනයේ සියලු අංශ පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, එවැනි පර්යේෂණ පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම, දිරි ගැන්වීම සහ ඒවාට ආධාර කිරීම.

v. ආයතනය විසින් කරනු ලැබූ යම් සේවා ගාස්තු හෝ අය කිරීම් නියම කිරීම.

vi. ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම.

vii. ආයතනයේ සේවා නියුක්තයන් සඳහා අර්ථසාධක අරමුදල් පිහිටුවා පවත්වාගෙන යාම සහ සුභසාධන සහ විනෝදාස්වාද පහසුකම් සැලසීම.

viii. ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම.

ix. ආයතනයේ ව්‍යාපාරයේ කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා පාලක මණ්ඩලය විසින් අවශ්‍ය යැයි සළකනු ලබන කටයුතු ආයතනයේ යම් සාමාජිකයෙකුට, අධ්‍යක්ෂවරයාට හෝ යම් සේවා නියුක්තයකුට පැවරීම.

x. විවිධ සාමාජිකත්ව ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් තක්සේරු කිරීම සහ ආයතනයේ සියලු සාමාජිකත්ව ශ්‍රේණි සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා විධිවිධාන සැලසීම සහ ඒ විභාගය සඳහා අධ්‍යයන පාඨමාලා ප්‍රවර්ධනය කිරීම, සැපයීම හෝ අනුමත කිරීම.

xi. ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය කටයුතු සහ සාමාන්‍ය පැවැත්ම උසස් තත්ත්වයක පවතින බවට වග බලා ගැනීම හා එම තත්ත්වය ආරක්ෂා කිරීම.

xii. වැවිලි කර්මාන්ත කළමනාකරණයෙහි ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

xiii. වැවිලි ක්ෂේත්‍රයට සහ වැවිලි කළමනාකරණයට අදාළ දත්ත එකතු කිරීම් සහ බෙදා හැරීම් භාර ගැනීමට සහ වැවිලි කර්මාන්තවල සංවර්ධන ශක්‍යතාව අවබෝධ කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම.

xiv. වැවිලි කර්මාන්ත කළමනාකරණයට උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ වෙනත් අදාළ නියෝජ්‍යායතන සමග සම්බන්ධීකරණය වීම.

පාලක මණ්ඩලයේ විෂය පථය

සමාලෝචිත වර්ෂය තුළ දී ආයතනයේ පාලක මණ්ඩලයේ රැස්වීම් **06** ක් අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතන පරිශ්‍රයේ දී පවත්වන ලදී. මෙම පාලක මණ්ඩල රැස්වීම් අතරතුර පහත සඳහන් ප්‍රධාන කරුණු හා ක්‍රියාකාරකම් සමාලෝචනයට භාජනය කර ඒ සඳහා සුදුසු පරිදි අනුමැතීන් ලබා දී ඇත.

- ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් ඉහළම අනුකූලතාවකින් යුතුව ඉටු කළ බවට සහතික කිරීම.

- පුහුණු අංශයේ සියලුම මෙහෙයුම් හා ක්‍රියාකාරකම්හි පාරදෘශ්‍යභාවය හෙළිදරව් වන ආකාරයට කටයුතු කළ බව සහතික කිරීම.

- ආයතනයේ සියලුම පාර්ශ්වකරුවන් වෙත අපේක්ෂිත ප්‍රතිඵල ලබා දීම සඳහා ආයතනය සතු සම්පත් ඉහළ ඵලදායිතාවකින් හා කාර්යක්ෂමතාවකින් යුතුව මෙහෙයවීම.

- ආයතනයේ මධ්‍ය හා දිගු කාලීන උපාය මාර්ග, වාර්ෂික අය වැය සහ ක්‍රියාකාරී සැලසුම, සැළකිය යුතු මූල්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම හා අනුමැතිය ලබා දීම.

පාලක මණ්ඩල සාමාජිකයින්

1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ 06 වන වගන්තිය සහ 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 දරණ සංශෝධිත පනත්වල විධි විධානවලට අනුව 2020 වර්ෂයේ පාලක මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

පාලක මණ්ඩල සාමාජිකයාගේ නම	තත්ත්වය	පාලක මණ්ඩල සාමාජිකයාගේ නම	තත්ත්වය
ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන මහතා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	සභාපති	මහින්ද විද්‍යානපතිරණ මහතා සභාපති කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	සාමාජික
ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	සාමාජික	ආචාර්ය කාංචන සිල්වා මහතා අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි තුරුසවිය අරමුදල	සාමාජික
අරුණි. එස්. රණසිංහ මිය අතිරේක ලේකම් (පාලන) වැවිලි අමාත්‍යාංශය	සාමාජික	ගිහාන් ද ලිවේරා මහතා නියෝජිත තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය	සාමාජික
ආචාර්ය එල්.එස්.කේ. හෙට්ටිආරච්චි මහතා අධ්‍යක්ෂ තේ පර්යේෂණ ආයතනය	සාමාජික	එස්.කේ.එල්. ඔබේසේකර මහතා ලේකම් ජනරාල් ශ්‍රී ලංකා වැවිලිකරුවන්ගේ සංගමය	සාමාජික
ආචාර්ය සී.එස්. රණසිංහ මිය අධ්‍යක්ෂ පොල් පර්යේෂණ ආයතනය	සාමාජික	පී.ඒ.එම්. දැරණියගල මහතා නියෝජිත ශ්‍රී ලංකා පොල් වගා කරුවන්ගේ සංගමය	සාමාජික
එස්.එන්. මීතලාව මිය අධ්‍යක්ෂ ජාතික අය වැය දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය	සාමාජික		

- **ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන මහතා ආයතනයේ සහ පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස 2020 ජූලි මස සිට පත් කරන ලදි.**

- **එස්.එන්. මීතලාව මිය (අධ්‍යක්ෂ/ජාතික අය වැය දෙපාර්තමේන්තුව) 2020 පෙබරවාරි මස සිට පත් කරන ලදි.**

- **මහින්ද විද්‍යානපතිරණ මහතා (සභාපති/කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය) 2020 මාර්තු මස සිට පත් කරන ලදි.**

- **ආචාර්ය කාංචන සිල්වා මහතා (අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි, තුරුසවිය අරමුදල) 2020 පෙබරවාරි මස සිට පත් කරන ලදි.**

- **ගිහාන් ද ලිවේරා මහතා (නියෝජිත/තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය) 2020 මාර්තු මස සිට පත් කරන ලද අතර ඒ මහතා සේවයෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් 2020 දෙසැම්බර් මස සිට සාමාජිකත්වයෙන් ඉවත් විය.**

විගණන හා කළමනාකරණ කමිටුවේ විෂය පථය

ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුකූලව පිහිටුවා ඇති අතර, පහත සඳහන් ලේඛන සහ වාර්තා අධ්‍යයන කොට සුදුසු නිර්දේශ ලබා දීම සඳහා එම කමිටුව වෙත නිසි අධිකාරී බලය ආයතනයේ පාලක මණ්ඩලය මඟින් පිරිනමා ඇත.

- ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ඵලදායී ලෙස පවත්වාගෙන යාම සහතික වීම
- විගණන විමසුම් හා විගණන වර්තාවලට අදාළ කරුණු හා ආයතනය විසින් සකස් කරන ලද පිළිතුරු නිර්දේශ කිරීම
- අයවැය ඇස්තමේන්තු සහ සත්‍ය කාර්ය සාධනයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම
- ආයතනයේ අනෙකුත් මූල්‍ය ක්‍රියාකාරකම්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම

2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇති අතර, එම රැස්වීම් ජූලි 28, නොවැම්බර් 20 හා දෙසැම්බර් 24 යන දිනයන්හි දී පවත්වා ඇත.

විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය

සාමාජිකයාගේ නම	තත්ත්වය	සාමාජිකයාගේ නම	තත්ත්වය
එස්.එන්. මීතලාව මිය අධ්‍යක්ෂ/ජාතික අයවැය දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය	සභාපති	මහින්ද විද්‍යානපතිරණ මහතා සභාපති කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	විකල්ප සාමාජික
අරුණි. එස්. රණසිංහ මිය අතිරේක ලේකම් (පාලන) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	සාමාජික	ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	ආයතනයේ නියෝජිත
ආචාර්ය කාංචන සිල්වා මහතා අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි තුරුසවිය අරමුදල	සාමාජික	එල්. ඩී. ජේ. ප්‍රියන්ත මහතා ගණකාධිකාරි ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	ආයතනයේ නියෝජිත
ජයන්ත පුෂ්පකුමාර මහතා විගණන අධිකාරි විගණකාධිපති දෙපාර්තමේන්තුව	නිරීක්ෂණ සාමාජික	කේ.එච්.යූ.පී. විජේවීර මහතා අභ්‍යන්තර විගණක ජාතික වැවිලි කළමනාකරණ ආයතනය	ලේකම් විගණන හා කළමනාකරණ කමිටුව
එස්.යූ.ඩී. මානවසිංහ මහතා විගණන අධිකාරි ජාතික විගණන කාර්යාලය	නිරීක්ෂණ සාමාජික		

- එස්.එන්. මීතලාව මිය (අධ්‍යක්ෂ/ජාතික අය වැය දෙපාර්තමේන්තුව) 2020 පෙබරවාරි මස සිට පත් කරන ලදි.

- ජයන්ත පුෂ්පකුමාර මහතා (විගණන අධිකාරි/ජාතික විගණන කාර්යාලය) සේවයෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් 2020 අගෝස්තු මස සිට සාමාජිකත්වයෙන් ඉවත් විය.

- එස්.යූ.ඩී. මානවසිංහ මහතා (විගණන අධිකාරි/ජාතික විගණන කාර්යාලය) 2020 නොවැම්බර් මස සිට පත් කරන ලදි.

- ආචාර්ය කාංචන සිල්වා මහතා (අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි, තුරුසවිය අරමුදල) 2020 පෙබරවාරි මස සිට පත් කරන ලදි.

- මහින්ද විද්‍යාපතිරණ මහතා (සභාපති/ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය) 2020 මාර්තු මස සිට පත් කරන ලදි.

2020 වසරේ දී විගණන හා කළමනාකරණ කමිටුව ඉහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය. මුදල් අමාත්‍යාංශයේ නියෝජිත, එස්.එන්. මීතලාව මිය එහි සභාපතිත්වය හොබවන ලදී.

<u>ආයතනයේ කාර්ය මණ්ඩලය</u>

අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වන අතර, ඔහු වැවිලි අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. 2020 වර්ෂය අවසාන වන විට ස්ථීර කාර්ය මණ්ඩලය 55 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය ප්‍රධාන අංශ පහකින් සමන්විත වේ. එනම් පුහුණු අංශය, ගිණුම් අංශය, පරිපාලන අංශය, විභාග අංශය හා අභ්‍යන්තර විගණන අංශය වේ.

<u>සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි</u>



ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන මහතා
සභාපති



ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි

පුහුණු අංශය

පුහුණු අංශයේ විධායක නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ තනතුරු



එස්. එන්. ඉලංගන්තිලක මිය
පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික (පුහුණු අංශ ප්‍රධානී)



පී.එච්. ජයතිලක මහතා
පුහුණු කිරීමේ විශේෂඥ
(ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)



ආර්.එන්. ලොකුහෙට්ටි මිය
පුහුණු කිරීමේ විශේෂඥ
(කළමනාකරණ)



එච්.එම්.වී.එස්. බණ්ඩාර මහතා
පුහුණු කිරීමේ නිලධාරි
(ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)



පී.ඩබ්.ජී.එන්.සී. වීරකෝන් මහතා
පුහුණු කිරීමේ නිලධාරි
(කළමනාකරණ)



එන්.එස්. හෙට්ටි ආරච්චි මහතා
පුස්තකාලයාධිපති

ගිණුම් අංශය

ගිණුම් අංශයේ විධායක නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ තනතුරු



එල්.ඩී.ජේ. ප්‍රියන්ත මහතා
ගණකාධිකාරි



එන්.එල්. සේනාධීර මිය
ගිණුම් සහකාර

පරිපාලන අංශය

පරිපාලන අංශයේ විධායක නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ තනතුරු



එම්.එල්.ආර්. ජයන්ත මහතා
පරිපාලන නිලධාරි



එම්.බී.එම්.ඒ.එල්. බණ්ඩාරනායක මහතා
නේවාසිකාගාර කළමනාකරු
අතුරුගිරිය

විභාග අංශය

විභාග අංශයේ විධායක නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ තනතුරු



ඩී.එල්.පී. කුලසේකර මහතා
පුහුණු කිරීමේ නිලධාරි
(කෘෂි ආර්ථික)



ජේ.ඒ.ඩී.ජී.එම්. ඉන්ද්‍රානි මිය
වැඩසටහන් නිලධාරි
(විභාග හා සම්බන්ධීකරණ)

අභ්‍යන්තර විගණන අංශය



කේ.එච්.යු.පී. විජේවීර මහතා
අභ්‍යන්තර විගණක

2020.12.31 දිනට කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

පුහුණු අංශය (සමස්ත කාර්ය මණ්ඩලය - 15)

පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික)	**01**
පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ)	**01**
පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)	**01**
පුහුණු කිරීමේ විශේෂඥ (වැවිලි කළමනාකරණ)	**-**
සහකාර අධ්‍යක්ෂ (අලෙවිකරණ, ව්‍යාපාර ප්‍රවර්ධන හා සැලසුම්)	**-**
පුහුණු කිරීමේ නිලධාරි (කළමනාකරණ)	**01**
පුහුණු කිරීමේ නිලධාරි (වැවිලි ඉංජිනේරු)	**-**
පුහුණු කිරීමේ නිලධාරි (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)	**01**
මාණ්ඩලික සහකාර (පුහුණු)	**01**
පුස්තකාලයාධිපති	**01**
කළමනාකරණ සහකාර	**07**
ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර	**01**

ගිණුම් අංශය (සමස්ත කාර්ය මණ්ඩලය - 07)

ගණකාධිකාරි	**01**
ගිණුම් සහකාර	**01**
කළමනාකරණ සහකාර	**05**

පරිපාලන අංශය (සමස්ත කාර්ය මණ්ඩලය - 28)

සහකාර අධ්‍යක්ෂ (පාලන)	-
පරිපාලන නිලධාරි	01
නේවාසිකාගාර කළමනාකරු	01
ප්‍රසම්පාදන සහකාර	-
කළමනාකරණ සහකාර	06
රියදුරු	07
අරක්කැමි	-
උද්‍යාන සහායක	02
කාර්යාල කාර්ය සහායක	05
නේවාසිකාගාර සහායක	03
මුද්‍රණ සහකාර	01
කම්කරු	02
සනීපාරක්ෂක කම්කරු	-

විභාග අංශය (සමස්ත කාර්ය මණ්ඩලය - 03)

පුහුණු කිරීමේ නිලධාරි (කෘෂි ආර්ථික)	01
වැඩසටහන් නිලධාරි (විභාග හා සම්බන්ධීකරණ)	01
කළමනාකරණ සහකාර	01

අභ්‍යන්තර විගණන අංශය (සමස්ත කාර්ය මණ්ඩලය - 01)

අභ්‍යන්තර විගණක	01


ආයතනයේ පරිපාලන අංශය පිළිබඳ සමාලෝචනය

පරිපාලන අංශය, සහකාර අධ්‍යක්ෂ (පාලන) විසින් මෙහෙයවනු ලබයි. ආයතනයේ සාමාන්‍ය පරිපාලන කටයුතුවල වගකීම ඔහු විසින් දරන අතර, කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, සේවක උසස් කිරීම්, මානව සම්පත් සංවර්ධනය, සේවක ගැටලු විසඳීම ආදී සියලු කටයුතු පරිපාලන අංශය විසින් මෙහෙයවනු ලබයි. ආයතනයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවීම ද පරිපාලන අංශය විසින් සිදු කරනු ලබයි.

අතුරුගිරිය ප්‍රධාන කාර්යාලය හා බගවන්තලාව මධ්‍යස්ථානය භාවිතා කරමින් නවාතැන් පහසුකම් අවශ්‍ය බාහිර ආයතන සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම සිදු කරනු ලබයි.

සේවක ප්‍රතිලාභ

ආයතනික කළමනාකාරීත්වය විසින් සේවකයන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප සහ කුසලතා වැඩි දියුණු කිරීම පිණිස දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම සිදු කරනු ලබයි. **2019** වසරේ දී පැවැති ආයතනික වෛද්‍ය රක්ෂණාවරණය ඇතුලු අනෙකුත් සුභ සාධන කටයුතු **2020** වසරේ දී තවදුරටත් පවත්වා ගෙන යන ලදි.


සභාපති සහ පාලක මණ්ඩලය
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි
ජෙෂ්ඨ කළමනාකරණ මට්ටම (HM 1-2)
විභාග අංශය
පුහුණු අංශය
පාලන අංශය
මූල්‍ය අංශය
අභ්‍යන්තර විගණන
වැවිලි කළමනාකරණ
කෘෂි විද්‍යා
කළමනාකරණ හා මූල්‍ය
මධ්‍යම කළමනාකරණ නිලධාරීන් (MM 1-1)
පුහුණු කිරීමේ විශේෂඥ (වැවිලි කළමනාකරණ)
පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික)
පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)
පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ)
සහකාර අධ්‍යක්ෂ (අලෙවි ව්‍යාපාර ප්‍රවර්ධන හා සැලසුම්)
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ගණකාධිකාරී
කණිෂ්ඨ කළමනාකරණ නිලධාරීන් (JM 1-1)
වැඩසටහන් නිලධාරි (විභාග)
පුහුණු කිරීමේ නිලධාරි (වැවිලි ඉංජිනේරු)
පුහුණු කිරීමේ නිලධාරි (කෘෂි ආර්ථික)
පුස්තකාලයාධිපති
පුහුණු කිරීමේ නිලධාරි (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)
පුහුණු කිරීමේ නිලධාරි (කළමනාකරණ)
පරිපාලන නිලධාරි
නේවාසිකාගාර කළමනාකරු අතුරුගිරිය
නේවාසිකාගාර කළමනාකරු බගවන්තලව
අභ්‍යන්තර විගණක
ආශ්‍රිත නිලධාරීන් (MA 3)
මාණ්ඩලික සහකාර (පුහුණු)
ප්‍රසම්පාදන සහකාර
ගිණුම් සහකාර
කළමනාකරණ සහකාර (තාක්ෂණික)(MA 2-1)
ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන (MA 1-1)
කළමනාකරණ සහකාර (10)
කළමනාකරණ සහකාර (06)
කළමනාකරණ සහකාර (05)
ප්‍රාථමික මට්ටම (පුහුණු) (PL-3)
ටියදුරු -7
ප්‍රාථමික මට්ටම (පුහුණු) (PL-2)
අරක්කැමි-2
ප්‍රාථමික මට්ටම (නුපුහුණු) (PL-1)
කාර්යාල කාර්ය සහායක - 5
මුදුණ සහායක - 1
උද්‍යාන සහායක - 5
සනිපාරක්ෂක කම්කරු - 1
කම්කරු - 2
නේවාසිකාගාර සහායක - 5

ආයතනයේ පුහුණු අංශය පිළිබඳ සමාලෝචනය

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය (NIPM) වැවිලි ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන්/අධ්‍යයන පාඨමාලා සාර්ථකව නිම කරන්නන් සඳහා සහතිකපත් ප්‍රදානය කිරීමට සහ සුදුසුකම් ලත් වතු විධායක නිලධාරීන්ට වෘත්තීය සාමාජිකත්වය ලබා දීම සඳහා බලය ලත් එකම රාජ්‍ය ආයතනය වේ. තේ, රබර්, පොල්, උක්, කජු, කුරුඳු සහ තල් භෝග ආශ්‍රිත කුඩා වතු හිමියන් ඇතුළු වැවිලි කර්මාන්තයේ නියුක්තවුවන්ගේ වෘත්තීය නිපුණතාව වර්ධනය කිරීම මෙම ආයතනයේ කාර්යභාරයක් වන අතර, ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් මූලික ක්‍රියාකාරකම් පහත පරිදි ප්‍රධාන කාණ්ඩ 07 ක් යටතේ දැක්විය හැක.

1) අධ්‍යාපනික වැඩසටහන්

පාඨමාලා සඳහා සහභාගීවන්නන්ගේ අධ්‍යාපනික සුදුසුකම් හා නිපුණතාවන් වැඩි දියුණු කිරීමේ අරමුණින් අධ්‍යාපනික පාඨමාලා සැලසුම් කර ඇත. අධ්‍යාපනික වැඩසටහන්වල පහත සඳහන් පාඨමාලාවන් ඇතුළත් වේ.

- **B.Sc.** වැවිලි කළමනාකරණ උපාධිය. (වයඹ විශ්ව විද්‍යාලය සමඟ එක්ව)
- ජාතික වැවිලි කළමනාකරණ ඩිප්ලෝමාව.
- වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව. (NVQ මට්ටම 6)
- වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව. (NVQ මට්ටම 5)
- වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව. (NVQ මට්ටම 5)
- වැවිලි කළමනාකරණ හා තාක්ෂණ ඩිප්ලෝමාව
- පොල් වගාව හා නිෂ්පාදනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව.
- වැවිලි ගිණුම්කරණය, මූල්‍ය හා පිරිවැය කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව (CMA ආයතනය සමඟ ඒකාබද්ධව)
- පොත් තැබීම හා වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව.
- ප්‍රජා බලගැන්වීම සහ ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.
- ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලා (NVQ මට්ටම 4)





2) වෘත්තීය වැඩසටහන්

වෘත්තීය පාඨමාලා පැවැත්වීමෙහි ප්‍රධාන අරමුණ වනුයේ වැවිලි අධ්‍යාපනයෙහි විවිධ පැතිකඩයන් පිළිබඳ න්‍යායාත්මක / ප්‍රායෝගික දැනුම, ආකල්ප සහ කුසලතා පුහුණුව ලබා දීම වේ. වැඩසටහන් සඳහා සහභාගීවන්නන්ගේ වෘත්තීය නිපුණතාවන් තක්සේරු කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා මෙම පාඨමාලාවන් සැලසුම් කර ඇත.



ආයතනය විසින් පවත්වනු ලබන වෘත්තීය වැඩසටහන් පහත පරිදි වේ.

- තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- රබර් නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- භාෂා ප්‍රවීණතා විභාගය

3) නිපුණතා සංවර්ධන වැඩසටහන්

මෙම කාණ්ඩය යටතේ ඇති වැඩසටහන් විශේෂයෙන්ම නිර්මාණය කර ඇත්තේ විශේෂිත රැකියා සඳහා සෘජුවම අදාළ වන කුසලතා හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා ය. වැඩසටහන් සඳහා සහභාගීවන්නන් නවීන තාක්ෂණය හා වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයන් සමඟ සමීප කර වීම මේ තුළින් අපේක්ෂා කරනු ලබයි.

ආයතනය විසින් පහත සඳහන් නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- තාක්ෂණික සංවර්ධන වැඩසටහන්
- කුසලතා සංවර්ධන වැඩසටහන්
- කම්කරු සංවර්ධන වැඩසටහන්
- කළමනාකරණ සංවර්ධන වැඩසටහන්
- කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්
- වැඩමුළු, සම්මන්ත්‍රණ හා සම්මේලන
- කුඩා වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන්



4) වැවිලි කළමනාකරණයට අදාළව ප්‍රකාශන නිකුත් කිරීම. (වැවිලි කළමනාකරණය සම්බන්ධ සඟරා, පුවත් පත්‍රිකා, ශිෂ්‍ය අත්පොත හා අනෙකුත් වාර සඟරා)

5) වැවිලි කළමනාකරණය පිළිබඳ පර්යේෂණ හා උපදේශන සේවා සැපයීම හා රාජ්‍ය/පෞද්ගලික අංශයේ සංවිධාන සඳහා සේවකයන් බඳවා ගැනීමට හා උසස් කිරීමට අදාළ පරීක්ෂණ හා විභාග. (වාචික සහ ලිඛිත)

6) සුදුසුකම් ලබන වතු විධායකයින්ට වෘත්තීය සාමාජිකත්ව ප්‍රදානය කිරීම. (ගරු සාමාජිකත්වය, සම සාමාජිකත්වය, ආශ්‍රිත සාමාජිකත්වය හා ශිෂ්‍ය සාමාජිකත්වය)

7) බාහිර ආයතනවලට ඔවුන්ගේ පුහුණු වැඩසටහන් සහ අදාළ ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා ආයතනයේ පහසුකම් ලබා දීම (ආහාර, නවාතැන් සහ දේශන ශාලා ආදිය)

පුහුණු වැඩසටහන්වල ප්‍රගති සමාලෝචනය

ආයතනය විසින් මූලිකවම ප්‍රධාන කාණ්ඩ 2ක් යටතේ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. එනම් වැවිලි ආයතනික අංශය සඳහා ආදායම් උත්පාදන වැඩසටහන් සහ රාජ්‍ය අරමුදල් භාවිතයෙන් විශේෂයෙන්ම කුඩා වතු හිමි අංශය සඳහා නොමිලයේ පවත්වනු ලබන ධාරිතා සංවර්ධන වැඩසටහන් වේ.

රටේ අභියෝගාත්මක පාරිසරික තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මාර්ගගත අධ්‍යාපන ක්‍රමයට අනුගත විය. වැවිලි ක්ෂේත්‍රයට අදාළව නව මාර්ගගත වැඩමුළු හඳුන්වා දීම සහ ඉහත තාක්ෂණය හරහා ක්‍රියාත්මක වැඩසටහන් සම්පූර්ණ කිරීමට හැකි වීම.

ආදායම් උත්පාදන වැඩසටහන්වල ප්‍රගතිය

ආයතනයට ආදායම් උත්පාදනය කිරීම සඳහා ආයතනය විසින් 2020 වසරේ දී පහත දැක්වෙන අධ්‍යාපනික හා වෘත්තීය වැඩසටහන් පවත්වා ඇත.

ආදායම් උත්පාදන වැඩසටහන් විස්තර 2020

අංකය	වැඩසටහන	එක් එක් වැඩසටහනට ගත වූ කාලය	පැවැත්වූ වැඩසටහන් ගණන	සහභාගී වූ ගණන
අධ්‍යාපනික වැඩසටහන් 2019/2020				
01	වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව	මාස 18	1	15
02	වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව. NVQ මට්ටම 5	මාස 18	1	32
තාක්ෂණ සංවර්ධන වැඩසටහන්				
03	තේ රස බැලීම සහ වර්ගීකරණය	දින 03	1	14
කළමනාකරණ සංවර්ධන වැඩසටහන්				
04	ඵලදායීතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන	දින 01	1	43
කුසලතා සංවර්ධනය වැඩසටහන්				
05	තේ කර්මාන්තශාලා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන්	දින 05	1	14
කම්කරු නිපුණතා සංවර්ධන				
06	රබර් කිරි කපන්නන් සඳහා කම්කරු නිපුණතා සංවර්ධන වැඩසටහන - ඕපාත වතුයාය	දින 01	1	35
07	රබර් කිරි කැටීම සහ වැසි ආවරණ සවි කිරීම සඳහා කම්කරු නිපුණතා සංවර්ධන වැඩසටහන	දින 01	1	65

මාර්ගගත වැඩමුළු				
08	ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රය දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය විය යුත්තේ කෙසේද යන්න පිළිබඳ දැනුවත් කිරීමේ මාර්ගගත වැඩමුළුව	දින 01	1	12
09	ඉඩම් නීතිය සහ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම පාලනය කිරීම පිළිබඳ මාර්ගගත වැඩමුළුව	දින 01	1	25
කාර්ය මණ්ඩල සංවර්ධන පුහුණු වැඩසටහන්				
10	සාමාන්‍යයෙන් සිදු වන විගණන විමසීම්වලට පිළිතුරු සැපයීම පිළිබඳ වැඩමුළුව	දින 01	1	29
11	විනය ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	දින 01	1	12
12	කාර්යාල ක්‍රියා පටිපාටි පිළිබඳ පුහුණු වැඩසටහන	දින 01	1	42
විශේෂ වැඩසටහන්				
13	තුරු සවිය අරමුදල සඳහා පවත්වන ලද විශේෂ වැඩසටහන	දින 02	1	25
14	යන්ත්‍ර සූත්‍ර සේවා කිරීමේ තාක්ෂණය සහ නඩත්තු කිරීම	දින 01	1	19
13 වසරක සහතික කරන ලද අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන - **NVQ 4**				
15	තේ කර්මාන්තශාලා නිලධාරී සහ තේ ක්ෂේත්‍ර නිලධාරී- **NVQ 4**	**මාස 06**	3	71
	එකතුව		**17**	**453**

(වගුව 1)

මෙයට අමතරව පෙර වසරේ දී ආරම්භ කරන ලද පහත සඳහන් අධ්‍යයන පාඨමාලාවන් සහ විභාගයන් අඛණ්ඩව මෙම වසරේ දී ද පවත්වා නිම කරන ලදී. ඒවා පහත සඳහන් පරිදි වේ.

2019 වසරේ සිට අඛණ්ඩව පවත්වනු ලබන වැඩසටහන්වල ප්‍රගතිය

අංකය	වැඩසටහන	පැවැත් වූ වැඩසටහන් ගණන	එක්එක් වැඩසටහනට ගත වූ කාලය	සහභාගීවූ ගණන
01	වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව	02	මාස 18	17
02	වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව.	01	මාස 18	29

03	වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව.	01	මාස 12	20
04	වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (NVQ - 06)	01	මාස 12	16
05	වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NVQ -05)	01	මාස 12	23
06	වැවිලි කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	01	මාස 12	15
07	තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිවය පිළිබඳ වෘත්තීය වැඩසටහන	01	දින 09	21
08	වැවිලි ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	01	මාස 14	15
09	පොත් තැබීම හා වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	01	මාස 12	16
10	ශුද්ධ මුල්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	දින 10	25
එකතුව		**10**		**197**

(වගුව 2)

ආදායම් උත්පාදන පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය - 2020




ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්ම තුළින් අපේක්ෂිත ආදායම් උත්පාදන වැඩසටහන් සංඛ්‍යාව **27** ක් වන අතර ආයතනය වැඩසටහන් **17** ක් පවත්වා ඇත. **2020** වසරේ දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාවේ ප්‍රගතිය **62%** ලෙස වාර්තා වී ඇත. වසර අවසානයේ දී ආයතනය විසින් අපේක්ෂිත පුහුණු ආදායමට සමගාමීව **59%** ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත. **2020** වසර සඳහා ඉලක්ක කළ පුහුණුවන්නන් සංඛ්‍යාව **507** ක් වූ අතර ඉන් වතු කාර්ය මණ්ඩලය **453** දෙනෙකු පුහුණු කළ හැකි විය. එය **90%** ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. පුහුණු වැඩසටහන්වල අඩු ප්‍රගතියක් පෙන්වීමට ප්‍රධාන හේතුව වූයේ කොවිඩ් **19** වසංගත තත්ත්වය යටතේ පාඨමාලා පැවැත්වීමට තිබූ අසීරුතාවයි.

පහත දැක්වෙන වගුව **(අංක 3)** තුළින් **2020** වසරේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය නිරූපනය කරනු ලබයි.


පුහුණු වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වැඩසටහනේ නම	ඇස්තමේන්තුව			සත්‍ය			ප්‍රගතිය (ප්‍රතිශත)		
	වැඩසටහන් ගණන	සිසුන් ගණන	ආදායම (රු.මිලි)	වැඩසටහන් ගණන	සිසුන් ගණන	ආදායම (රු.මිලි)	ආදායම (රු.මිලි)	සිසුන් ගණන	වැඩසටහන් ගණන
අධ්‍යාපනික හා වෘත්තීය වැඩසටහන්	8	157	11.51	2	47	0.96	25%	27%	8%
කුසලතා සංවර්ධන වැඩසටහන්	2	29	0.81	1	14	0.28	50%	48%	35%
තාක්ෂණික සංවර්ධන වැඩසටහන්	1	14	0.46	1	14	0.46	100%	100%	100%
විශේෂ පුහුණු වැඩසටහන්/ වැඩමුළු	10	119	0.75	7	164	0.52	70%	138%	69%
කළමනාකරණ සංවර්ධන වැඩසටහන්	3	58	0.44	1	43	0.29	33%	74%	64%
13 වසරක සහතික කරන ලද අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන	2	70	25.06	3	71	13.48	150%	101%	53%
කම්කරු සංවර්ධන වැඩසටහන්	1	60	0.03	2	100	0.06	200%	200%	200%
එකතුව	27	**507**	39.06	17	**453**	16.05	62%	90%	41%
අනෙකුත් පුහුණු ආදායම්									
බාහිර විභාග	-		0.86	-	-	0.94	-	-	109%
ප්‍රකාශන අලෙවිය	-		-	-	-	6.60	-	-	-
බාහිර වැඩසටහන්	-		-	-	-	0.14	-	-	-
මුළු පුහුණු ආදායම	**27**	**507**	**39.92**	**17**	**453**	**23.73**	**62%**	**90%**	**59%**

(වගුව 03)



(ප්‍රස්තාර 01)



(ප්‍රස්තාර 02)

ආදායම් උත්පාදන වැඩසටහන්වල ලාභ අලාභ විශ්ලේෂණය

ආදායමක් ඉපැයීමේ අරමුණින් ආයතනය විසින් ඉතා සුළු අයකිරීමකින් විවිධ අධ්‍යාපනික, වෘත්තිය හා කුසලතා වර්ධන පුහුණු පාඨමාලා පවත්වනු ලබයි. 2020 වසර තුළ දී පුහුණු ක්‍රියාකාරකම්වලින් මුළු පුහුණු ආදායම වන රු.මි. 23.58 න් 62% සාමාන්‍ය ලාභාන්තිකයක් සහිතව රු.මි. 14.66 ක ශුද්ධ ආදායමක් වාර්තා කර ඇත. පෙර වර්ෂයේ සංඛ්‍යා ලේඛන අනුව මුළු පුහුණු ආදායම වන රු.මි. 69.01 න් රු.මි. 43.89 ක ශුද්ධ ආදායමක් පෙන්වන ලදී. ඒ අනුව පසුගිය වසරට සාපේක්ෂකව ශුද්ධ ආදායම 77% කින් අඩු වී ඇත. සෑම වැඩසටහනක් සඳහාම මෙම ලාභ අලාභ විශ්ලේෂණය පහත අංක 04 වගුවේ දක්වා ඇත.

වැඩසටහන් කාණ්ඩය	ආදායම රු.මිලි	පිරිවැය රු.මිලි	ලාභ/අලාභ	ලාභ ප්‍රතිශතය
අධ්‍යාපනික හා වෘත්තීය වැඩසටහන් පසුගිය වසරේ සිසුන් ද ඇතුළත්ව	7.55	3.11	4.44	58%
කළමනාකරණ සංවර්ධනය	0.29	0.17	0.12	41%
තාක්ෂණික සංවර්ධනය	0.46	0.13	0.33	72%
කුසලතා සංවර්ධනය	0.28	0.14	0.14	50%
කම්කරු සංවර්ධන වැඩසටහන්	0.06	0.04	0.02	33%
වැඩමුළු හා විශේෂ වැඩසටහන්	0.52	0.18	0.34	65%
13 වසරක සහතික කරන ලද අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන	13.48	4.61	8.87	65%
බාහිර විභාග වලින් ලද ආදායම	0.94	0.54	0.40	42%
එකතුව	**23.58**	**8.75**	**14.66**	**62%**

(වගුව 4)

පාසල් අධ්‍යාපනය නිමවූ සිසුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) සහිත නිපුණතා සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

වැවිලි ක්ෂේත්‍රයට අවශ්‍ය කරන සුදුසුකම් සහිත ආධුනිකයින් පිරිසක් බිහිකිරීමේ අරමුණින් සාර්ථකව **NVQ 4** මට්ටම් පාඨමාලාවන් නිම කිරීමට හැකි විය. ජාතික වෘත්තීය සුදුසුකම යනු කුසලතාව පදනම් කරගත් සුදුසුකමකි. රැකියාවක් කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප වලින් යුත් පරිපූර්ණ පුද්ගලයෙකු බිහි කිරීම මෙහි අරමුණයි.

ජාතික වෘත්තීය සුදුසුකම් **NVQ 4** ආකෘතිය අනුව ජාතික වැවිලි කළමනාකරණ ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව සංවිධානය කරනු ලබන 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ වතු ක්ෂේත්‍රයේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිණිස පහත අරමුණු ඉටුකර ගැනීම සඳහා **NVQ 4** මට්ටමේ පාඨමාලා සාර්ථකව පවත්වන ලදී.

1. අ.පො.ස පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉහළ අධ්‍යාපනය සඳහා සමත්කම් නොදක්වන සිසුන් සඳහා ජාතික වෘත්තීය ප්‍රවේශය යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට අවස්ථාව සලසා දීම.

2. සිසුන්ගේ අධ්‍යාපනය සැලකිල්ලට ගෙන ඒ සඳහා යෝග්‍ය අධ්‍යාපන ක්‍රමයක් අ.පෙ.ස (සාමාන්‍ය පෙළින්) පසු ලබා දීම.



3. අධ්‍යාපනය සඳහා වෘත්තීය ජීවිතය තුළ සුදුසු වූ රැකියාවක් ලබාගැනීම සඳහා අවස්ථාව ලබා දීම.

4. දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ ඉහළ රැකියා ඉල්ලුමක් පවතින ක්ෂේත්‍රයන් සඳහා වෘත්තීමය විෂයයන් හඳුන්වා දීම.

ජාතික වෘත්තීය කුසලතා රාමුව අනුගමනය කරමින් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, වැවිලි ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීම සඳහා පහත **NVQ 4** පාඨමාලා පවත්වන ලදී.

<u>තේ කර්මාන්තශාලා නිලධාරී</u>

- තේ නිෂ්පාදනයේ තාක්ෂණික සහ කළමනාකරණ අංශ පිළිබඳව පුහුණු අවස්ථාවන් සැපයීම.
- කර්මාන්තශාලා මට්ටමින් තීරණ ගැනීමට සහ කාර්ය සාධනය නිරීක්ෂණය කිරීමට තොරතුරු භාවිත කරමින්, කාර්යක්ෂමව සහ ඵලදායීතාවකින් යුක්තව කාර්යයන් තුළින් කර්මාන්තශාලා හා කාර්යාල කටයුතු පිළිබඳ දැනුම හා අවබෝධය වැඩි කිරීම.
- ආධුනික තේ කර්මාන්තශාලා නිලධාරීන් ලෙස වඩාත් සුදුසු අයදුම්කරුවන් හඳුනා ගැනීම සහ තෝරාගැනීම සඳහා වැවිලි සමාගම් සහ පෞද්ගලික තේ කම්හල්වලට අවස්ථාව ලබාදීම.

<u>ක්ෂේත්‍ර නිලධාරී</u>

- විධිමත් කෘෂිකාර්මික හා ක්ෂේත්‍රගත පුහුණුවකින් පසු වතු පරිපාලනය මෙන්ම වෘත්තීය නිපුණතාවලින් හෙබි ක්ෂේත්‍ර නිලධාරීන් බිහිකිරීම සඳහා කෘෂිකාර්මික දැනුම, තේ වතු ඉඩම් කළමණාකරණය ආදී ක්ෂේත්‍ර සඳහා න්‍යායාත්මක, තාක්ෂණික සහ කළමනාකරණය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීම.
- ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස වඩාත් යෝග්‍ය තරුණ පුහුණුලාභීන් හඳුනාගැනීම සහ තෝරාගැනීම සඳහා තේ වතු සමාගම් සහ තේ වතු හිමියන් සඳහා අවස්ථාව සැලසීම.

මෙම වර්ෂයට අදාළව සැලසුම් කළ තේ ක්ෂේත්‍ර නිලධාරී සහ තේ කර්මාන්තශාලා නිලධාරී පාඨමාලා සාර්ථකව නිම කිරීමට ආයතනයට හැකි විය. තව ද, එම පාඨමාලා නිම කළ සියලුම සිසුන්ට රැකියා අවස්ථා සොයා ගැනීමට හැකිවීම මෙම පාඨමාලාවලින් ලද ඉහළම ජයග්‍රහණයකි.

වෙනත් ආයතන සඳහා විභාග පැවැත්වීමේ ප්‍රගතිය

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ එක් අරමුණක් වනුයේ වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් විවිධ විෂයන් සඳහා උපදේශන සේවා සැපයීමයි. 1987 සිට ආයතනය විසින් වැවිලි අංශයේ විශේෂඥයන් වූ විවිධ රාජ්‍ය/පෞද්ගලික අංශ ආයතනවල සේවකයන් ප්‍රවර්ධනය කිරීම සහ නව සේවකයන් බඳවා ගැනීමට අදාළ වන විභාග පැවැත්වීමේ පහසුකම් සපයනු ලැබේ.පෙර වසරවල අත්දැකීම්වලට අනුව 2020 වසරේ දී ආයතනය විසින් විභාග 10 ක් පවත්වා රුපියල් මිලියන 0.94 ක ආදායමක් උපයා ඇත. පහත දැක්වෙන වගු අංක 07 න් එම විභාගවල තොරතුරු නිරූපනය කරනු ලබයි.

2019 වසරේ දී පැවැත්වූ විභාගයන්

ආයතන	විභාග ගණන	අයදුම්කරුවන් ගණන	ඉපයූ ආදායම් (රු.)
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය I - පොල් සංවර්ධන අධිකාරිය	1	44	0.210
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය - පොල් පර්යේෂණ ආයතනය	1	22	0.130
ඇල්කඩුව වතු සමාගමේ සහකාර වතු අධිකාරීවරුන් හා වතු අධිකාරීවරුන් සඳහා කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය	1	11	0.014
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය I - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	1	11	0.026
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය II - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	1	2	0.017
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය III - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	1	3	0.024
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය II - පොල් සංවර්ධන අධිකාරිය	1	23	0.158
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය - ජාතික පශු සම්පත් දෙපාර්තමේන්තුව	1	131	0.313
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය IV - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	1	1	0.021
කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණය V - ශ්‍රී ලංකා තේ මණ්ඩලය	1	8	0.025
එකතුව	10	256	**0.941**

(වගුව 5)

වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාවේ ප්‍රගතිය



මෙම උපාධි වැඩසටහන 2006 වර්ෂයේ සිට ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සමඟ එක්ව පිරිනමනු ලැබේ.

වැවිලි ක්ෂේත්‍රයේ සහ ඒ ආශ්‍රිත අංශවල ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්, විධායක නිලධාරීන්, තාක්ෂණික නිලධාරීන් සඳහා මෙම උපාධි වැඩසටහන විශේෂයෙන් ඉලක්ක කර ඇත. අදාළ පළපුරුද්ද සමඟ ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මඟින් පවත්වනු ලබන ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කළ සිසුන්ට ද උපාධි පාඨමාලාවට අයැදුම් කිරීමට හිමිකම් ඇත. මෙමඟින් උසස් දැනුමක් සහ පුළුල් වෘත්තීය සහ ශාස්ත්‍රීය පුහුණුවක් ලබා දෙන අතර, එමඟින් ඔවුන්ට තම ආයතනවල සඵල හා කාර්යක්ෂම කළමනාකරුවන් වීමට හැකියාව ලබා දීම මෙහි අරමුණ වේ.

මෙම වැඩසටහන අධ්‍යයන වාර හයකින් යුත් තෙවසරක කාලසීමාවකින් යුක්ත වන අතර ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් සහ විවිධ ආයතනවල සේවය කරන පර්යේෂකයින්ගෙන් සමන්විත සම්පත් මඩුල්ලකින් යුක්ත වේ. මෙම උපාධි වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිඵල පහත පරිදි වේ.

- වැවිලි ක්ෂේත්‍රයේ කළමනාකරණ, විධායක සහ තාක්ෂණික මට්ටමේ නිලධාරීන්ට වැවිලි කළමනාකරණයට අදාළ තාක්ෂණික හා කළමනාකරණ කුසලතා වැඩිදියුණු කිරීමට සහ සංවර්ධනය කිරීමට අවස්ථා ලබා දීම සඳහා,
    - න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීම
    - ප්‍රායෝගික සැසි සංවිධානය කිරීම, රසායනාගාර ශිල්පීය ක්‍රම සහ උපකරණ හැසිරවීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම
    - අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රායෝගික භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා අදාළ ආයතන වෙත අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම
- වැවිලි තාක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ ඉහළ විද්‍යාත්මක පසුබිමක් සැපයීම.
- තාක්ෂණය, පරිසර සැකසුම, වැවිලි භෝග සඳහා වෙළඳපොල ප්‍රවණතාව, පාරිභෝගික හැසිරීම් සම්බන්ධයෙන් ගෝලීය වෙනස්කම් හඳුනා ගැනීම පිණිස වතු කළමනාකරුවන්ට සහ විධායකයින්ට මගපෙන්වීම.

එක් එක් වසරවල දී ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව හා එම පාඨමාලාව සාර්ථකව අවසන් කළ සිසුන් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

ලියාපදිංචි හා සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව

	වසර	ලියාපදිංචි සිසුන් ගණන	නිම කළ සිසුන් ගණන
1	2006	21	16
2	2007	17	11
3	2008	35	21
4	2009	34	16
5	2010	47	29
6	2011	32	17
7	2012	54	37
8	2013	81	-
9	2014	91	52
10	2015	105	17
11	2016	121	70
12	2017	117	48
13	2018	143	55
14	2019	180	73
15	2020	275	

(වගුව 6)

කුඩා වතු හිමියන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය - 2020

ආයතනය විසින් වැවිලි ක්ෂේත්‍රයේ කුඩා වතු හිමියන් වැවිලි කර්මාන්තයට දක්වන දායකත්වය සහ එම අංශයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ වැදගත්කම හඳුනා ගෙන ඇත. කුඩා වතු හිමියන්ගේ දැනුම හා ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ආයතනය විසින් 2020 වසර සඳහා රු.මිල. 4.15 ක මූල්‍ය වෙන් කිරීමක් යටතේ පුහුණු වැඩසටහන් 83 ක් සැලසුම් කරන ලදී. නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එය රු. මී. 2.5 ක මුල්‍ය වෙන් කිරීමක් යටතේ වැඩසටහන් 50ක් ඔවට සංශෝධනය කිරීමට සිදු විය. කෙසේ වුවද වසර තුළ දී ආයතනය විසින් කුඩා වතු හිමියන් සඳහා රු.මිලි 0.52 ක මුදලක් වැය කරමින් වැඩසටහන් 14 ක් පවත්වා ඇත. කුඩා වතු හිමියන් සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- මත් ද්‍රව්‍ය නිවාරණ
- ආකල්ප සංවර්ධන
- කළමනාකරණ සංවර්ධන
- ව්‍යවසායකත්ව සංවර්ධන
- තාක්ෂණික නිපුණතා සංවර්ධන



පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන්වල විස්තර වගු අංක 5 හි පරිදි වේ.

කුඩා වතු හිමියන් සඳහා පැවැත්වූ ධාරිතා සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

වැඩසටහන් වර්ගය	අපේක්ෂා කළ වැඩසටහන්	අපේක්ෂා කළ සහභාගිවන්නන්	ඇස්තමේන්තු පිරිවැය	පැවැත්වූ වැඩසටහන් ගණන	සහභාගිවූවන් ගණන	පිරිවැය (රු.මිලි)
කුඩා රබර් වතු හිමියන්	15	750	0.75	3	98	0.12
කුඩා තේ වතු හිමියන්	15	750	0.75	6	331	0.20
කුඩා පොල් වතු හිමියන්	12	600	0.6	3	170	0.12
අනෙකුත් බෝග	8	400	0.4	2	94	0.08
එකතුව	**50**	**2,500**	**2.5**	**14**	**693**	**0.52**
ප්‍රගතිය	-	-	-	**24%**	**28%**	**20%**

(වගුව 7)

2020 දී ආයතනය වැඩසටහන් 50 ක් සැලසුම් කළ අතර භෞතික ප්‍රගතියෙන් 24% ක් සහ මූල්‍ය ප්‍රගතියෙන් 20% ක් සමඟින් වැඩසටහන් 14 ක් පමණක් පවත්වා ඇත.

පෙර වසරට සාපේක්ෂව පුහුණු වැඩසටහන් ලබා ඇති ප්‍රගතිය.

2019 වසරට සාපේක්ෂව වැඩසටහන් සංඛ්‍යාව සහ සහභාගිවන්නන් සංඛ්‍යාව සහ පුහුණු වැඩසටහන් මඟින් උපයන ලද ආදායමේ යම් අඩුවක් පෙන්නුම් කරයි. මෙම අඩුවීමට ප්‍රධානම හේතුව වූයේ රටේ පැවති කොවිඩ් -19 වසංගත තත්ත්වයයි. ආයතනය මඟින් පවත්වනු ලබන ප්‍රායෝගික වැඩසටහන්වලට මෙන්ම ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන්වලට ද මෙය තදින්ම බලපාන ලදී.

ආදායම් උපයන වැඩසටහන් සංඛ්‍යාවේ 66% ක ද සහභාගිවන්නන් සංඛ්‍යාවේ 62 % ක ද අඩුවීමක් වාර්තා විය. පුහුණු වැඩසටහන් ආදායම 86% කින් අඩු වී ඇත. 2019 වසරේ දී ආයතනයට ප්‍රධාන ම ආදායම ලැබුනේ 13 වසරක සහතික කරන ලද අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන මඟිනි. නමුත් කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වැඩසටහන 2020 දී ක්‍රියාත්මක වූයේ නැත.

කුඩා වතු අංශයේ පුහුණු වැඩසටහන් සංඛ්‍යාවේ සහ සහභාගි වුවන් සංඛ්‍යාවේ පිළිවෙළින් 89% ක හා 87% ක අඩුවීමක් දක්නට ලැබේ. කුඩා වතු හිමියන් සඳහා වූ වැඩසටහන්වලට දරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ද පසුගිය වසර හා සසඳන විට 88% ක අඩුවීමක් ඇත.

පහත අංක 06 වගුවෙන් 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ ප්‍රගතිය

2019 වසරට සාපේක්ෂව 2020 වසරේ ප්‍රගතිය

	2019	2020	ප්‍රතිශතය වැඩි වූ/(අඩු වූ)
වැඩසටහන් ගණන (ආදායම් උත්පාදන වැඩසටහන්)	41	17	-41%
සහභාගී වූවන් ගණන (ආදායම් උත්පාදන වැඩසටහන්)	1015	449	-55%
පුහුණු ආදායම (රු. මි.)	69.29	23.73	-65%
කුඩා වතු හිමියන් සඳහා වූ වැඩසටහන් ගණන	106	14	-86%
පුහුණුව ලැබූ කුඩා වතු හිමියන් ගණන	5414	693	-87%
කුඩා වතු හිමියන්ගේ පුහුණුව සඳහා	3.64	0.52	-85%

(වගුව 8)





1987 අංක **05** දරන සංශෝධන පනතේ සඳහන් නිර්ණායක හා කොන්දේසි මත පදනම්ව ආයතනය විසින් යෝග්‍ය සාමාජිකයන් සඳහා වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීම අඛණ්ඩව කර ගෙන යනු ලබයි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ආයතනය විසින් විධායක නිලධාරීන් **9** දෙනෙකු සඳහා ආශ්‍රිත සාමාජිකත්ව **09** ක් පිරිනමන ලදී. **2020** වසර අවසානය වන විට එක් එක් කාණ්ඩ යටතේ සිටින මුළු වෘත්තීය සාමාජිකයන් ගණන පහත පරිදි වේ.

කාණ්ඩය	සංඛ්‍යාව
ගරු සාමාජිකත්ව	22
සම සාමාජිකත්ව	227
ආශ්‍රිත සාමාජිකත්ව	29
ශිෂ්‍ය සාමාජිකත්ව	01
එකතුව	**281**



වගුව අංක **09**

වැවිලි ක්ෂේත්‍රයේ අනාගත දැක්ම ප්‍රතිනිර්මාණය කිරීම සහ සාමාජිකයින් අතර තොරතුරු බෙදා ගැනීම අරමුණු කර ගනිමින් 2020 වර්ෂයේ දී ආයතනය විසින් ශ්‍රී ලංකාවේ තිරසර වැවිලි කළමනාකරණය සඳහා වූ ඒකාබද්ධ ප්‍රවේශයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. රට තුළ පැවති Covid-19 තත්ත්වය සැලකිල්ලට ගනිමින්, මෙම වැඩසටහන කල් දමා වෘත්තීය සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2021 පෙබරවාරි මාසයේදී ක්වීන්ස්බරි හෝටලයේදී පැවැත්විණි.

ආයතනය සපයන පහසුකම්

පුස්තකාල පහසුකම්

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුස්තකාලයේ තොරතුරු මූලාශ්‍ර **4200** වැඩි ප්‍රමාණයක් ඇති අතර, පොත්, සඟරා සහ වාර සඟරා, පෝස්ටර්, පත්‍රිකා, ලිපි සහ CD, DVD ලෙස වර්ගීකරණය කර ඇත. තවද, එම මූලාශ්‍ර වර්ග වශයෙන් සංවර්ධනය වෙමින් පවතී; බැහැර දෙන අංශයේ එකතු සංවර්ධනය කිරීම,

විමර්ශන අංශයේ එකතු සංවර්ධනය කිරීම සහ ඉහත සියලු තොරතුරු මූලාශ්‍ර Dewely Decimal Classifiacaton - DDC අනුව වර්ගීකරණය කර ඇත.



ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුස්තකාලය සතුව තේ, රබර්, පොල්, කජු සහ කෘෂිකර්මාන්තය වැනි වැවිලි කර්මාන්තවලට අදාළ වටිනා පොත් එකතුවක් දැනටමත් තිබේ. තවද ගිණුම්කරණය, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණ අලෙවිකරණය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය, පරිගණක විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව, සාමාන්‍ය දැනුම සහ විනෝදාස්වාදය සම්බන්ධ පොත් එකතුවක් සංවර්ධනය වෙමින් පවතී. ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුස්තකාලය, ස්වයංක්‍රීය පුස්තකාලයක් බවට පත් කිරීමෙන් එය පර්යේෂණ පුස්තකාලයක් බවට පරිවර්තනය කිරීමේ පළමු පියවර තබා ඇත. 2021 වන විට එහි වැඩ නිම කිරීමට අපේක්ෂා කෙරේ.

ඉගෙනුම් මධ්‍යස්ථානය

ආයතනය මඟින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්වල ප්‍රයෝගික සැසි සඳහා සහ වැවිලිකරුවන් වීමට අපේක්ෂිතයින් සඳහා තේ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව හඳුන්වා දීමට ආයතනය සතුව ඉගෙනුම් මධ්‍යස්ථානයක් ඇත. නවීන යන්ත්‍රෝපකරණ වලින් සමන්විත මෙම මධ්‍යස්ථානයේ එක් වරකට 20 දෙනෙකු සඳහා පුහුණු පහසුකම් ඇති අතර, තේ රස බැලීමේ පුහුණු ඒකකයක් ද ස්ථාපිත කර ඇත.





නවාතැන් පහසුකම්

ආයතනය සතුව අධ්‍යාපනික හා පුහුණු මධ්‍යස්ථානයකට අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් ඇත. දේශීය හා විදේශීය ඉල්ලුම තෘප්තිමත් කිරීමට හැකි වන පරිදි ආයතනය වැඩි දියුණු කිරීමට හා නවීකරණය කිරීමට ජාතික අයවැය මඟින් වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. අතුරුගිරිය පුහුණු මධ්‍යස්ථානයේ වායු සමීකරණය කරන ලද දේශණ ශාලා 3ක් හා ශ්‍රවණාගාරයක් ඇත. ශ්‍රවණාගාරයේ වරකට පුද්ගලයින් 200 දෙනෙකුට ඉඩ පහසුකම් සැලසිය හැකිය. 60 දෙනෙකු සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීමේ හැකියාව ආයතනය සතු වේ.





නේවාසිකාගාර පහසුකම්

ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - බගවන්තලාව

ආයතනයේ එක් පුහුණු මධ්‍යස්ථානයක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ බගවන්තලාව ප්‍රදේශයේ ස්ථාපනය කර ඇත. එහි ශ්‍රවණාගාරයේ පුද්ගලයන් 100 කට දේශණ පහසුකම් සැපයිය හැකි අතර, 50 දෙනෙකුට දේශණ පහසුකම් සැපයිය හැකි මධ්‍යම පරිමාණ දේශන ශාලා 2ක් ඇත.

බගවන්තලාව නේවාසිකාගාරයේ වරකට පුද්ගලයන් 70 කට ආසන්න ප්‍රමාණයකට නවාතැන් පහසුකම් සැපයිය හැකිය. මෙහි විශාල භෝජනාගාරයක්, කාර්යාල කාමර 3 ක් හා ග්‍රන්ථ 600 කට වඩා ඇති කුඩා පුස්තකාලයක් ඇති අතර නේවාසිකාගාර කළමනාකරු සඳහා බංගලාවක් ද ඇත.




ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය - දෙනියාය

ආයතනයේ තවත් පුහුණු මධ්‍යස්ථානයක් දකුණු පළාත සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ පහසුකම් සැපයීම සඳහා 2018 වර්ෂයේ දී දෙනියාය ප්‍රදේශයේ ස්ථාපිත කරන ලදී.

නේවාසිකාගාර, දේශන ශාලා, ආහාරපාන වැනි පහසුකම් සැපයීම මඟින් උපයා ගන්නා ලද ආදායම

නේවාසිකාගාර, දේශන ශාලා, ආහාරපාන වැනි පහසුකම් සැපයීම මඟින් උපයා ගන්නා ලද ආදායම පහත ප්‍රස්තාරයෙන් දක්වා ඇත.

කොවිඩ් 19 -වසංගත තත්ත්වය නිසා බොහෝ ආයතන වැඩසටහන් නොපැවැත්වීම හේතුවෙන් 2020 වර්ෂයේ දී එම පහසුකම් සැපයීම මඟින් ලැබූ ආදායම සැලකිය යුතු මට්ටමකින් පහත වැටී ඇත.



(ප්‍රස්තාර 03)

අපගේ ක්‍රියාකාරකම්



ජාතික ධජය ඔසවා රාජ්‍ය සේවා ප්‍රතිඥාව ලබා දෙමින් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සේවක මණ්ඩලය 2020 වර්ෂය සඳහා සේවය ආරම්භ කිරීම

2020 පෙබරවාරි 04 වන දින ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 72 වැනි නිදහස් සංවත්සරය සමරන ලදී. එදින එම උත්සවයත් සමඟ 04 වන වතාවටත් ආයතනය මඟින් පවත්වනු ලබන ක්‍රිකට් තරගාවලිය පැවැත් විණි. අතුරුගිරිය, වානේ සංස්ථා ක්‍රීඩාංගනයේ පැවති එම තරගයට ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සේවක මණ්ඩලය, සිසුන් හා ආදී ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් ද සහභාගි විය.





ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සභාපති වශයෙන් විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම්, ඒ එල් ඒ අසෝක සිරිවර්ධන මහතා 2020 ජූලි මස සිට පත් කරන ලදී.

2020 සැප්තැම්බර් 24 වන දින ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ඉගෙනුම් මධ්‍යස්ථානය, වැවිලි අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ රාජ්‍ය අමාත්‍ය ගරු කණක හේරත් මැතිතුමාගේ සහභාගීත්වයෙන් විවෘත කරන ලදී.



මූල්‍ය සමාලෝචනය

කාර්ය සාධනය

පසුගිය වසරට සාපේක්ෂව **2020** වර්ෂයේ දී අත්කර ගන්නා ලද මූල්‍ය කාර්ය සාධනයේ සාරාංශය පහත සඳහන් වේ.

	2020 රු. මිලි.	**2019** රු. මිලි.	අඩු වීම හෝ වැඩි වීම	ප්‍රගතියේ ප්‍රතිශතය (%)
මුළු ආදායම	**210.34**	**244.62**	**(34.28)**	**(14%)**
රජයේ ප්‍රදානයන් පුනරාවර්තන ප්‍රාග්ධන විශේෂ සංවර්ධන ව්‍යාපෘති	 **57.81** **25.75** **80.81**	 **54.00** **21.00** **60.78**	 **4.81** **4.75** **20.03**	 **8.9%** **22.6%** **32.9%**
පුහුණු ආදායම වෙනත් ආදායම	**23.74** **21.21**	**69.29** **39.55**	**(45.54)** **(17.34)**	**(65.7%)** **(43.8%)**
මුළු වියදම	**113.52**	**138.82**	**(25.29)**	**(18.2%)**
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ පුහුණු හා පාඨමාලා වියදම් වෙනත් වියදම්	**45.13** **11.34** **57.03**	**43.42** **32.39** **63.01**	**1.72** **(21.04)** **(5.97)**	**3.9%** **(64.9%)** **(9.4%)**
ශුද්ධ අතිරික්තය	**96.81**	**105.89**	**(9.07)**	**(8.5%)**

(වගුව 10)

2020 වසර භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදනයන්හි යම් ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. ඒ අනුව පිළිවෙළින් පුනරාවර්තන ප්‍රතිපාදන **8.9%** කින් ද ප්‍රාග්ධන ප්‍රතිපාදන **22.6%** කින් ද විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන දායකත්වය **32.9%** කින් ද වැඩි වී ඇත.

2020 වසරේ පුහුණු වැඩසටහන් තුළින් උපයන ආදායම **2019** වර්ෂයට සාපේක්ෂව යම් පසුබෑමක් පෙන්නුම් කරන අතර, එම අගය රු. මිලියන **45.54** කින් පහත වැටී ඇත. ඒ අනුව **2019** වර්ෂයට

සාපේක්ෂව ප්‍රගතිය අඩු වීම 65.7% ක් ලෙස දැක්විය හැක. 2020 වසරේ මුහුණ දුන් කොවිඩ් 19 වසංගත තත්ත්වය මේ සඳහා බලපාන ලදී.

2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව මුළු වියදම රු. මිලියන 25.29 කි. පුහුණු වියදම් සහ අනෙකුත් වියදම් පිළිවෙළින් පහත වැටීම හේතුවෙන් 18.2% ක ඍණ ප්‍රගතියක් වාර්තා කරයි.

සේවක වැටුප් හා සේවක සුභ සාධන වියදම 2020 වසරේ දී 3.9% කින් වර්ධනය වී ඇති අතර, ආදායම අඩු වීමට සාපේක්ෂව පුහුණු වියදම ද අඩු වී ඇත. එම අගය රු. මිලියන 21.04 ක් ලෙස සටහන් වූ අතර, පුහුණු වියදම අඩු වීමේ ප්‍රතිශතය 64.9% කි.

ක්ෂය වීම්වල වටිනාකම ඇතුළුව අනෙකුත් වියදම් රු. මිලියන 5.97 කින් අඩු වී ඇත. එය පෙර වර්ෂයට සාපේක්ෂව 9.4% ක අඩු වීමකි.

වෙනත් වියදම්හි යම් අඩු වීමක් පෙන්නුම් කළ අතර, 2020 වසර අවසානයේ දී ශුද්ධ අතිරික්තය රු. මිලියන 96.81 ක් ලෙස සටහන් විය. එය 2019 වසරට සාපේක්ෂව 8.5% ක අඩු වීමකි.

දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් මුළු ලොවම කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් වසා තැබීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම අඩු වීම පෙන්නුම් කළ හැකි වුව ද, සමස්ත ආයතනයේ ප්‍රගතිය සැලකිය යුතු මට්ටමක රඳවා ගැනීමට කළමනාකාරීත්වයට හැකි වී ඇත.

2019 වසරට සාපේක්ෂව 2020 වසරේ මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය

2019 වර්ෂයට සාපේක්ෂව 2020 වසරේ මූල්‍ය තත්ත්වයේ විචලනය පහත වගුවෙහි සඳහන් කර ඇත.

	2020 (රු.මි.)	2019 (රු.මි.)	වෙනස (රු.මි.)	ප්‍රගතිය
මුළු වත්කම්	978.14	873.56	104.58	11.9%
ජංගම වත්කම්	272.01	247.13	24.88	10.0%
ජංගම වගකීම්	28.11	21.36	6.75	31.6%
ජංගම අනුපාතය	9.67	11.56	-1.89	-16.3%
ශුද්ධ වත්කම්	940.68	843.91	96.77	11.46%


(වගුව 11)

ජංගම වත්කම් වැඩි වීම 10% ක් ලෙස වාර්තා විය. සංවර්ධන ව්‍යාපෘති මත පැන නැගෙන ගෙවිය යුතු ජංගම වගකීම් අගය 31.6% කින් වැඩි විය. 2019 ට සාපේක්ෂව වත්මන් අනුපාතය 16.3% ක අඩු වීමක් පෙන්නුම් කළ ද, 2020 ජංගම අනුපාතය 9.67% ගැනීම මත ඉතා හොඳ මූල්‍ය ස්වභාවයක් පවතින බව සඳහන් කළ යුතුය.

ශුද්ධ වත්කම් රු. 96.77 කින් ඉහළ යාම මත 2019 ට සාපේක්ෂව 2020 වසරේ එම අගය 11.46% ක අගයක් ලබා ගෙන ඇත. 2020 ප්‍රාග්ධන වත්කම් හි ආයෝජනය මේ සඳහා ඇතුළත් කරන ලදී.

ශුද්ධ වත්කම්

මුළු ශුද්ධ වත්කම් රු. මිලියන 940.68 ක අතිරික්තයක් ජනනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2019 වසරට සාපේක්ෂව එය 96.87 ක් හා 11.4% ක ප්‍රතිශතයකි. දේශන ශාලා සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් සහිත නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ ආයෝජනය මෙම වර්ධනය සඳහා බලපා ඇත. උපාධි පිරිනමන ආයතනයක් දක්වා ආයතනයේ සංවර්ධනයට සමගාමීව දේශන ශාලා සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය ඇතුළත් නව ගොඩනැගිල්ල වෙනුවෙන් රජය විසින් රු. මිලියන 80.81 ක් ප්‍රදානය කර ඇත. එපමණක් නොව, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 25.75 ක් ලබා දී ඇත. 2014 සිට 2020 දක්වා ශුද්ධ වත්කම්වල වර්ධන ප්‍රවණතාව පෙන්නුම් කරයි.



ප්‍රස්ථාර 03

ද්‍රවශීලතාව තත්ත්වය

ද්‍රවශීලතාව පිළිබඳව සැලකීමේ දී ආයතනයේ ජංගම අනුපාතය 2020 වසර අවසානයේ දී එක් ජංගම වගකීමක් සඳහා 9.67 වරක් ලෙස පිළිබිඹු වීම මත ඉතා හොඳ මූල්‍ය ස්ථාවරත්වයක් පැවති බව නිගමනය කළ හැක. එමෙන්ම, එම අගය 2019 වසරේ දී 11.56ක් ලෙස සටහන් වී ඇති අතර, 2020 වසර අවසානයේ ජංගම වගකීම්වල වැඩි වීමක් පෙන්නුම් කිරීම මෙම තත්ත්වය සඳහා හේතු පාදක වී ඇත.

යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා ආයෝජනය කිරීම

2020 වර්ෂය තුළ රු. මිලියන **41.99** ක ස්පෘශ්‍ය වත්කම් සහ රු. මිලියන **0.24** ක අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී. **2020** වසර අවසානයේ දී දේපල සහ උපකරණවල ශුද්ධ වටිනාකම රු. මිලියන **502.49** ක් ලෙස වාර්තා විය. තේ රස බැලීමේ පුහුණු ඒකකය ඇතුළුව ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස පැරණි ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. මිලියන **12.46** ක මුදලක් සහ ඊට අදාල යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම සඳහා රු. මිලියන **14.0** ක මුදලක් ද වැය කරන ලදී. ගෘහ භාණ්ඩ උපකරණ මිලදී ගැනීම සහ සවි කිරීම සඳහා රු. මිලියන **4.0** ක් ද පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා රු. මිලියන **2.02** ක් ද වැය කරන ලදී.









NIPM ඉගෙනුම් මධ්‍යස්ථානය සහ තේ රස බැලීමේ පුහුණු ඒකකය

ඉහත කරුණුවලට අමතරව, ආයතනය නුදුරු අනාගතයේ දී උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය දක්වා වැඩි දියුණු කිරීම සඳහා ආයතනයේ පුහුණු පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කර ඇත. එම ව්‍යාපෘතියේ පළමු අදියර 2020 දී අවසන් කර ඇති අතර, ඒ සඳහා රු. මිලියන 216.9 ක මූල්‍ය ප්‍රදානයක් 2017 සිට 2020 දක්වා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත. 2021 වර්ෂයේ දී ආයතනය ජනනය කරන ලද අරමුදල් යොදා ගනිමින් ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කෙරේ.

ප්‍රාග්ධන වියදම්

ආයතනයේ ප්‍රාග්ධන වියදම් පිළිබඳව සැලකීමේ දී 2020 වර්ෂය තුළ මුළු ප්‍රාග්ධන වියදම රු. මිලියන 34.60 ක් වූ අතර, භාණ්ඩාගාරයෙන් ලැබුණේ රු. මිලියන 25.75 ක් පමණි. එබැවින් ආයතනය උපයන ලද ආදායමෙන් රු. මිලියන 8.85 ක මුදලක් වියදම් කිරීමට සිදු විය.

2020 වසරේ ප්‍රාග්ධන වියදම් සාරාංශය පහත සඳහන් වේ.

ප්‍රාග්ධන අයිතම	අස්තමේන්තු රු.මි.	සත්‍ය රු.මි.	ප්‍රගතිය
ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම හා ප්‍රතිසංවර්ධනය	12.01	8.13	67.6%
ලී බඩු මිලදී ගැනීම සහ වැඩි දියුණු කිරීම	11.83	9.37	79.2%
යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම	12.00	12.14	101.1%
ඉඩම් වැඩි දියුණු කිරීම	3.00	1.14	38.0%
මෘදුකාංග සංවර්ධනය	3.00	2.66	88.6%
ධාරිතා සංවර්ධන වැඩසටහන්	4.75	0.72	15.1%
වෙනත් ආයෝජන	0.30	0.19	63.3%
මුළු එකතුව	46.90	34.60	73.7%

(වගුව 12)

2020 වසර තුළ ආයතනය විසින් මුහුණ දුන් සංරෝධක

2020 වසර තුළ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පනවන ලද නිරෝධායන ඇඳිරි නීතිය හා ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් ආයතනයේ අපේක්ෂිත ඉලක්කයන් ලභා කර ගැනීමේ සැලකිය යුතු පසුබැමක් දක්නට ලැබුණි. අධ්‍යයන වැඩසටහන් වල න්‍යායාත්මක කොටස මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පැවැත්වුව ද ප්‍රායෝගික සැසි පැවැත්වීම තාවකාලිකව කල් දැමීමට සිදුවිය. විශේෂයෙන් ක්ෂේත්‍රයේ සිදු කළ යුතු කුඩා වතු හිමියන්ගේ වැඩසටහන් සියල්ල නවතා වෙනත් විකල්ප ක්‍රම මඟින් එම වැඩසටහන් පැවැත්වීමට ආයතනය කටයුතු කරන ලදී.

2020 වසර තුළ ආයතනයේ කාර්ය මණ්ඩල හිඟය මෙන්ම කාර්යාල සේවයට වාර්තා කිරීමේ දී මතු වූ දුෂ්කරතා ද ආයතනයේ අපේක්ෂිත ඉලක්කයන් ලභා කර ගැනීමට බාධාවන්ව පැවතුණි. එමෙන්ම, 2020 වසර තුළ ගෝලීය ආර්ථිකය යම් කඩා වැටීමකට ලක් වීම මත එයින් අත් වූ ඵල විපාක ද ආයතනයට අත් විඳීමට සිදුවිය.


උපාධි පිරිනමන ආයතනයක් දක්වා ආයතනයේ පුහුණු පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ආයතනයේ ඉදි කරමින් පවතින නව ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු නිම කිරීමේ ප්‍රමාදය බලපාන ලදී.

<u>නිගමනය</u>

2020 වසර තුළ කොවිඩ් **19** වසංගතයේ ව්‍යාප්තිය මත ආයතනයේ දෛනික කටයුතු වල පසුබෑමක් සිදු වුව ද, **2020** වසරේ මූල්‍ය තත්ත්වය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට ආයතනයට හැකි විය. ඒ සඳහා භාණ්ඩාගාරයෙන් ලද මූල්‍ය ප්‍රදාන ඉතා පිටුවහලක් වූ අතර, මේ නිසා **2020** වසරේ ශුද්ධ වත්කම රු. මිලියන **940.68** ක් දක්වා වැඩි කිරීමට හැකි විය.

පුහුණු වැඩසටහන් පැවැත්වීමේ යම් අඩු වීමක් පෙන්නුම් කළ ද, මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වන ලද පාඨමාලා සහ දිගු කාලීන පාඨමාලා තුළින් සැලකිය යුතු මූල්‍ය ආදායමක් ඉපයීමට ආයතනයට හැකිවිය.

NVQ 4 වන මට්ටමේ සිට **6** වන මට්ටම දක්වා පාඨමාලා සංවර්ධනය කළ අතර, **NVQ - 7** වන මට්ටම ලබා ගැනීම සඳහා ආයතනය උපාධි පිරිනමන ආයතනයක් දක්වා සංවර්ධනය කිරීමට අවශ්‍ය සියලු පහසුකම් **2020** වසරේ දී ලභා කර ගෙන ඇත.



සභාපති

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

2021.03.26

2020

මූල්‍ය වාර්තා

පටුන

මූල්‍ය වාර්තා	පිටුව
ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්	47 - 57
මූල්‍ය තත්ව ප්‍රකාශනය	58 - 59
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය	60
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	61 - 62
ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	63
අයවැය සහ සත්‍ය කාර්ය සාධනය	64
දේපල පිරියත හා උපකරණ ලේඛණය	65 - 66
අස්පෘශ්‍ය වත්කම් ලේඛණය	67
සටහන් හා උපලේඛණ	68 - 88
ඛණ්ඩන වාර්තාව	89 - 90
මූල්‍ය උපනතීන්	91 - 92
විගණකාධිපති වාර්තාව	93 - 102

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

2020 මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්

1.0 වාර්තාකරණ අස්ථිත්වය

1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ පනත යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සංස්ථාපනය කරන ලද මෙම ආයතනය 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 සංශෝධනයන් මඟින් වඩාත් ඵලදායී ශක්තිමත් රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සවිබල ගන්වා ඇත.

ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලාවන් සාර්ථකව නිම කරන අයවලුන් සඳහා සහතික පිරිනැමීම, සුදුසුකම්ලත් වැවිලි විධායකයින් වෙත වෘත්තීය සාමාජිකත්වය ලබා දීම සඳහා බලයලත් එකම ආයතනය ලෙස මෙම පනත හා සංශෝධනයන් මඟින් බල ගන්වා ඇත. මෙම ආයතනය තේ, රබර්, පොල්, උක්, කජු, කුරුඳු සහ තල් වැනි වැවිලි ක්ෂේත්‍රයේ කුඩා වතු හිමියන් ඇතුළුව එම වැවිලි ක්ෂේත්‍රයේ සේවයේ නියුක්තවූවන්ගේ වෘත්තීය නිපුණතාව උසස් මට්ටමින් පවත්වා ගෙන යාම පිළිබඳව සහතික වන අතර ඒ වෙනුවෙන් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විවිධ වැඩමුළු, දේශණ හා විභාගයන් පැවැත්වීම හා පර්යේෂණ සිදු කිරීම හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනයන් වෙත උපදේශණ සේවා ලබා දීම සිදු කරනු ලැබේ. ආයතනය දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල සමග එකතුව සාමූහිකව වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලා පැවැත්වීම සිදු කරන අතර විදේශීය සිසුන් සඳහා පාඨමාලා සංවිධානය සඳහා හැකියාව ආයතනය සතුව පවතී.

ආයතනයේ ලියාපදිංචි කාර්යාලය එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

2.0 පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය විසින් ප්‍රකාශිත රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව උපචිත පදනම මත මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත. මූල්‍ය වාර්තාවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, කාර්ය සාධන වාර්තාව, ශුද්ධ වත්කම් විචලනය පිළිබඳ වාර්තාව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ අයවැය හා සත්‍ය කාර්ය සාධන වාර්තාව සමග වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ඇතුළත් කර ඇත.

2.2 ඇගයීමේ පදනම

මූල්‍යය ප්‍රකාශනයන් පහත සඳහන් වැදගත් අයිතම හැරුණු විට ඓතිහාසික පිරිවැය පදනම්ව පිළියෙල කර ඇත.

- වාහන අගයන් ප්‍රත්‍යාගණන පදනම යටතේ ඉදිරිපත් කර ඇත.
- **2014** වසරේ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත සඳහා අනුගත වීමේ දී එදිනට පැවති දේපල උපකරණ හා පිරියත ප්‍රත්‍යාගණනය කර හෙලිදරව් කර ඇත. පසුව මිළදී ගනු ලබන වත්කම් කාලීන වාර්ෂික වාර්තාකරණ කාලය සඳහා පිරිවැය පදනම බල පැවැත්වේ. **2014.12.31** දින බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ දේපල ප්‍රත්‍යාගණනය කර **2015** සිට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර ඇත.
- සේවක විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ආයු ගණක පදනම මත අගය කර ඇත.
- **2019** වසරේදී ඉඩම් නැවත ප්‍රත්‍යාගණනය කර ඇති අතර එය ගිණුම් වාර්තාවල පෙන්නුම් කර ඇත.

2.3 මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශිත විනිමය

ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික මුදල් වන ශ්‍රී ලංකා රුපියල් මඟින් මූල්‍ය ප්‍රකාශණ ප්‍රකාශ කර ඇත.

3.0 <u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය</u>

අවිච්චින්න පැවැත්මේ සංකල්පය මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අතර, මෙම සංකල්පය ගිණුම්කරණ කාල සීමාව පුරා අඛණ්ඩව ශේෂයන් සදහන් කර නොමැති තත්ත්වයක් තුළ අදාළ රාජ්‍ය ප්‍රදාන පුහුණු වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, උපදේශන සේවා භාර ගැනීම, වාර්ෂික සාමාජික දායක මුදල් හා ප්‍රකාශන අලෙවිය තුළින් අරමුදල් සම්පාදනය කර ගනු ලැබේ. මෙමඟින් රැස් කරන සමුච්චිත අරමුදල් ආයතනයේ අවශ්‍යතාවය අනුව වගකීම් පියවීම හැකි පරිදි උපයෝගී කර ගනු ලැබේ.

3.1 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට සමුච්චිත ක්‍රමක්ෂය හා අපහායනයන් අඩු කිරීමෙන් පසු වාර්තා කරනු ලැබේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය සැලකිල්ලට ගෙන සරල මාර්ග ක්‍රමය උපයෝගී කර ගෙන අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කරනු ලැබේ. ඇස්තමේන්තුගත ජීවිත කාලය වාර්ෂිකව වාර්තා කරන කාල සීමාවන්හි විමර්ශනයට භාජනය කරන අතර එහි කිසියම් වෙනසක් වේ නම් පිරික්සුම් අගය පදනම්ව ගිණුම් ගත කරනු ලැබේ.

<u>පරිගණක මෘදුකාංග</u>

ආයතනය විසින් සංවර්ධිත ගිණුම්කරණ මෘදුකාංගය, වැටුප් පිළියෙල කිරීමේ මෘදුකාංග, පුහුණු දත්තයන් සහ සම්පත් කළමනාකරණ මෘදුකාංගයන් පරිගණකයෙහි මෙහෙයුම් පද්ධතියක කොටසක් නොවන අතර, අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගෙන ඇත. මෙම වත්කම් වසර 4 ක් තුළ ගිණුම් පොත්වලින් ලියා හැරීම සිදු කරනු ඇත.

<u>දුරස්ථ අධ්‍යාපන විෂය මාලා සංවර්ධනය</u>

දුරස්ථ අධ්‍යාපන විෂය මාලා සංවර්ධනය සඳහා වැය වන මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර, සංවර්ධිත විෂයමාලාවන්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය වසර 4 ක් ලෙස සැලකිල්ලට ගෙන ගිණුමෙන් ලියා හැරීමට කටයුතු කරනු ඇත.

<u>ආයතනයේ තේමා ගීතය</u>

ආයතනය විසින් දර්ශන සහිතව තේමා ගීතයක් නිර්මාණය කර ඇති අතර පිරිවැයේ ස්වභාවය සහ සංගීත අධ්‍යක්ෂණය සඳහා වැය පිරිවැය ගණනය සිදු නොවන අතර අස්පෘශ්‍ය වත්කමක් ලෙස සලකනු ලබන අතර ඒ සඳහා අවිනිශ්චිත ආයු කාලයක් පවතී. එබැවින් මෙම අස්පෘශ්‍ය වත්කම සඳහා ක්‍රමක්ෂය ගිණුමෙන් ලියා හැරීමක් සිදු නොවන වත්කමකි.

අස්පෘශ්‍ය වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීව කාලය පහත සඳහන් පරිදි ඇස්තමේන්තු ගත කර ඇත.

විස්තරය	පරිගණක මෘදුකාංග	දුරස්ථ අධ්‍යාපන පාඨමාලා සංවර්ධන පිරිවැය	NIPM තේමා ගීතය
ප්‍රයෝජනවත් ජීව කාලය	වසර 04	වසර 04	අදාළ නොවේ

3.2 <u>කුඩා වතු හිමියන් සහ පාසැල් හැර ගිය සිසුන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්</u>

කුඩා වතු හිමියන් සඳහා පවත්වන ධාරිතා සංවර්ධන වැඩසටහන් ප්‍රාග්ධන සංවර්ධන පිරිවැයක් ලෙස සලකනු ලබන අතර ඔවුන්ගේ දැනුම වර්ධනය වීමට හේතු පාදක වීම හා කුඩා වතු හිමියන්ගේ හැකියාවන් වර්ධනය වී ඇත. අවසාන පාරිභෝගිකයාගේ දැනට ගුණාත්වයෙන් ඉහළ

නිෂ්පාදනයන් ලබා දීම පෙරදැරිව කුඩා වතු හිමියන්ගේ කෘෂිකාර්මික දැනුම අපේක්ෂිත මට්ටමට සංවර්ධනය සඳහා කඩිනම් අවශ්‍යතාවයක් සේ සලකා මෙම වැඩසටහන් සංවිධානය කරන බැවින් මෙමඟින් ආයතනයේ කීර්තිනාමය සහ ආයතනය ප්‍රවර්ධනය සඳහා ද හේතු පාදක වී ඇත.

මෙම වැඩසටහනට අමතරව වැවිලි ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තු වන පාසැල් හැර ගිය සිසුන් සඳහා NVQ සහතිකය ලබා ගැනීමට හැකි පරිදි ඔවුන්ගේ කුසලතා වැඩි කිරීම පෙරදැරිව ආයතනය විසින් පාඨමාලා සංවිධානය කරනු ලැබේ.

මෙම වැඩසටහන්හි ප්‍රතිඵල අදාළ වර්ෂය තුළ දී උපලබ්ධි වන බවට උපකල්පනය කරන අතර, එම නිසා ආයෝජිත පිරිවැය එම වර්ෂයේ දී ම ලියා හරිනු ලැබේ.

2020 වසරේ ජාතික අයවැය මඟින් රු: මිලියන 0.53 ක මුදලක් වැය කර කුඩා වතු හිමියන්ගේ සහ කම්කරුවන්ගේ දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන් 14 ක් පවත්වා ඇති අතර, 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ පාසැල් හැර ගිය සිසුන් වෙනුවෙන් NVQ 4 මට්ටමේ පාඨමාලා 02 ක් සංවිධානය කර එම කටයුතු සාර්ථකව සිදු කර ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කුඩා වතු හිමියන්ගේ වැඩසටහන් බොහොමයක් 2021 වසර දක්වා කල් දමන ලදී.

3.3 <u>දේපල පිරියත හා උපකරණ</u>

දේපල පිරියත හා උපකරණ ඓතිහාසික පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ අපහායනයන් අඩු කිරීමෙන් පසු අගය පෙන්නුම් කර ඇත. වත්කම ක්‍රියාකාරී තත්ත්වයට පත් කරන තුරු වන සියලු ඍජු පිරිවැය මෙන්ම සැලකිය යුතු මට්ටමේ මහා පරිමාණ අළුත්වැඩියාවන් මෙම ඓතිහාසික පිරිවැයෙහි අන්තර්ගත කරනු ලැබේ.

දේපල පිරියත හා උපකරණයන්හි එක් එක් අයිතමයන්ගේ ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි වෙනස්කම් පවතින අතර ඒවා වෙන් වශයෙන් සැලකිල්ලට ගෙන ප්‍රයෝජනවත් ජීවිත කාලය අනුව ක්ෂය ගණනය කිරීම සිදු කෙරෙනු ලැබේ.

3.3.1 ප්‍රයෝජනවත් ජීව කාලය

සරල මාර්ග ක්‍රමය පදනම්ව ක්ෂය ගණනය කිරීම කරන අතර, වත්කමේ ජීවිත කාලය සැලකිල්ලට ගෙන පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කර ඇස්තමේන්තුගත ක්ෂය අගය වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ගිණුම්වලින් කපා හරිනු ලැබේ.

ප්‍රවර්තන හා පෙර වර්ෂ සඳහා අදාළ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ උපයෝගී කර ගත් ක්ෂය අනුපාතයන් පහත සඳහන් වේ. මෙම අනුපාතයන් ව්‍යාතිරේඛයන් යටතේ විශේෂයෙන් සඳහන් නොවන අවස්ථාවන්හි දී පොදුවේ භාවිතා වේ.

නිදහස් ගොඩනැගිලි	අවු. 20	5%
කාර්යාලීය ලී බඩු	අවු. 10	10%
මෝටර් වාහන	අවු. 05	20%
මාර්ග පද්ධති, ජල සැපයුම්, විදුලිය හා දුරකථන (යටිතල වත්කම්)	අවු. 10	10%
පුස්තකාල පොත්	අවු. 10	10%

<u>ව්‍යාතිරේඛයන්</u>

- උපකරණ යටතේ යන්ත්‍ර සූත්‍ර, කාර්යාලයීය උපකරණ සහ නේවාසිකාගාර ගෘහ උපකරණ හා භාණ්ඩ ඇතුළත් වේ. මෙම අයිතමයන්හි ජීව කාලය එකිනෙකට වෙනස් වන අතර එය පහත සඳහන් පරිදි තක්සේරු කර ඇත.

යන්ත්‍ර සූත්‍ර	වසර 5
කාර්යාලයීය උපකරණ	වසර 5
වෙනත් උපකරණ	වසර 4

- පරිගණක ජාලකරණය, යටිතල වත්කම් ලෙස වර්ගීකරණය කර පැවතිය ද ප්‍රයෝජනවත් ජීව කාලය වසර 5 ක් ලෙස ගණනය කර ඇත.

- 150 KVA විදුලි ජනක යන්ත්‍රය හා පිරියත යටතේ වර්ගීකරණය කර ඇති අතර එහි ප්‍රයෝජනවත් ආයු කාලය වසර 10 ක් ලෙස සැලකිල්ලට ගෙන ඇත.

- 2019 වර්ෂයේ සිට තිරරෙදි සහ නේවාසිකාගාරයේ ගෘහ උපකරණ (හැඳි, ගෑරුප්පු සහ පිගන්) ආදිය පාරිභෝගික වත්කම් ලෙස හඳුනා ගෙන වාර්ෂිකව පාරිභෝජන පිරිවැය ගණනය සඳහා යොදා ගනු ලැබේ.

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව යටිතල වත්කම් සඳහා පහත සඳහන් දෑ ඇතුළත් කර ඇත.

- මාර්ග සංවර්ධන වියදම්
- ජල සැපයීමේ හා බල උත්පාදන වියදම්
- විදුලි සැපයීමේ වියදම්
- පරිගණක ජාලකරණය

ක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ අවශේෂ වටිනාකම සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දී ම විමර්ෂණයට භාජනය කර නියමිත ගැලපිලි අවස්ථානුකූලව සිදු කරනු ලැබේ.

3.3.2 මිනුම්කරණ පදනම

වාහන හැර අනෙකුත් සියලුම වත්කම් පිරිවැය පදනම අනුව ක්ෂය කරන අතර වාහන ප්‍රත්‍යාගනන පදනම මත ක්ෂය කිරීම සිදු කරනු ලැබේ. ආයතනය සතු ඉඩම් ක්ෂය කිරීම සිදු කරනු නොලැබේ.

3.3.3 අපහරණය කිරීම

දේපල පිරියත උපකරණයන්හි අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති වීම අපහායනයෙන් භාවිතයෙන් ඉවත් කළ විට විකුණා ලැබෙන මිළ හා රැගෙන එන වටිනාකම සසඳා ලාභය හෝ පාඩුව තීරණය කරනු ලැබේ. මෙමඟින් ජනිත වන ලාභය හෝ පාඩුව මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ අන්තර්ගත කරනු ලැබේ.

3.3.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

ආයතනය වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය පවත්වා ආර්ථිකමය වශයෙන් භාවිතයට ගත නොහැකි ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා නිර්දේශ කරනු ලැබේ.

3.3.5 ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් අත්පත් කර ගත් ඉඩම් වල වර්තමාන තත්ත්වය

ආයතනය සතු වූ හෙක්ටයාර **1.9499** ක් වන භූමි ප්‍රමාණය සහ නිල නිවාස **03** ක අයිතිය ශ්‍රී ලංකා යුධ හමුදාවේ 7 වෙනි ඉංජිනේරු සේවා රෙජිමේන්තුව වෙත පවරා ඇත. මෙම ඉඩමේ අයිතිය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ **38 (අ)** වගන්තිය යටතේ පවරා ගෙන ඇත. **2018** ඔක්තෝම්බර් මාසයේ රු: මිලියන **155.0** ක වන්දි මුදලක් මෙම පවරා ගැනීම වෙනුවෙන් වන්දි වශයෙන් ආයතනයට ගෙවා ඇත. **2017** වසරේ සිට ක්‍රියාත්මක විශේෂ පාඨමාලා සංවර්ධන වැඩසටහන සඳහා මෙම මුදල වැය කිරීම වෙනුවෙන් තැන්පත් කර ඇත.

4.0 යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ඇති තැන්පතු

යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් සේවා සපයන ආයතනයන් ඉදිරිපත් කර ඇති සුරක්ෂිත තැන්පතු මේ සඳහා ඇතුළත් වේ.

5.0 තොගයන්

ආයතනයේ ප්‍රකාශන, මුද්‍රණ උපකරණ, ලිපි ද්‍රව්‍ය, කාර්යාල අවශ්‍යතා, ටයර්, ගොඩනැගිලි නඩත්තු උපකරණ සහ වෙනත් පාරිභෝග පරිහරණ ද්‍රව්‍යයන් තොගයේ අන්තර්ගත වේ. තොග ගණනය ප්‍රථම නිකුතු ප්‍රථම මිළ ක්‍රමය සැලකිල්ලට ගෙන ගණනය කරනු ලැබේ. තේ සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රදානය කළ පොත්වල වටිනාකම ප්‍රකාශන තොගයේ ඇතුළත් කර ඇත.

යොදාගත් පිරිවැය සමීකරණය = “ගත්මිළ + ගැලපුම් පිරිවැය + අනෙකුත් පිරිවැය”

තොගයන්හි රැගෙන එන වටිනාකම පහත ලැයිස්තු ගත කර ඇත.

අයිතමය	රැගෙන එන වටිනාකම ධාරණ අගයට රු. මිලියන	විකිණීමට පිරිවැය	රැගෙන එන සාධාරණ අගය රු. මිලියන
ලිපිද්‍රව්‍ය	527,295.30	-	527,295.30
මුද්‍රණ උපකරණ	1,291,720.00	-	1,291,720.00
සුභ සාධන අයිතම	35,839.00	-	35,839.00
පාරිභෝගික අයිතම	128,081.80	-	128,081.80
ගොඩනැගිලි නඩත්තු උපකරණ	232,340.00	-	232,340.00
ප්‍රකාශන	819,850.00	-	819,850.00

පිගන්, හැඳි ගෑරුප්පු නේවාසිකාගාරයේ මුළුතැන්ගෙයි සුළු උපකරණ සහ පරීක්ෂණාගාර උපකරණ

රෙදි අයිතම	1,265,947.50	-	1,265,947.50
හැඳි, ගෑරුප්පු සහ පිගන්	219,444.00	-	219,444.00
පරීක්ෂණාගාර උපකරණ	68,392.50		68,392.50
එකතුව	4,588,910.10	-	4,588,910.10

ප්‍රදානය කළ ප්‍රකාශනයන්

ප්‍රදානය කරන ලද ප්‍රකාශන පොත් වටිනාකම ප්‍රකාශන තොගයේ අන්තර්ගතය, ප්‍රදාන වටිනාකම විලම්භීත ආදායම් යටතේ ජංගම වගකීම්වල පෙන්නුම් කර ඇත. ආදායම අදාළ වර්ෂය තුළ දී උපලබ්ධි වන ආකාරය අනුව ගිණුම් ගත කරනු ලැබේ.

6.0 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ අත ඉතිරි මුදල් අතුරුගිරිය ලංකා බැංකුවේ ශාඛාවේ ජංගම ගිණුමේ ශේෂය සහ මාස තුනකට අඩු කෙටි කාලීන තැන්පතු ඇතුළත් ය.

7.0 මූල්‍ය උපකරණ

ණය, ලැබිය යුතු දෑ සහ තැන්පතු ගණුදෙනුව ඇති වූ අවස්ථාවේදීම ආයතනය මූලික වශයෙන් මූල්‍ය උපකරණයක් ලෙස හඳුනා ගන්නා අතර එම මූල්‍ය වත්කම් පරිනත වූ දිනයේ දී මූල්‍ය ප්‍රවාහය තුළට ඇතුළත් කරනු ලැබේ.

කල් පිරෙන තෙක් තබා ගන්නා මූල්‍ය වත්කම්

කල් පිරෙන තෙක් තබා ගැනීමේ අරමුණින් මූලිකව හඳුනා ගනු ලැබූ මූල්‍ය වත්කම් කල් තබා ගන්නා මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් මූලිකව හඳුනා ගැනීමේ දී ධාරණ අගයට සෘජුව බලපාන ගණුදෙනු පිරිවැය එකතු කර අපහායණයන් අඩු කර සළුල පොලී අනුපාත ක්‍රමයට ගණනය කරනු ලබයි.
මූල්‍ය වත්කම කල් පිරීමට පෙරාතුව කිසියම් විකිණීමක් හා නැවත වර්ගීකරණය කරනු ලබයි නම් නැවත විකිණීමට ඇති ආයෝජන ලෙස එම ආයතනයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොල මිළ තීරණය සඳහා ඉදිරිපත් නොවන අතර, එම වත්කම් මූලිකව ධාරණ අගයට සෘජුව සම්බන්ධ ගණුදෙනු පිරිවැය එකතු කර අගය කර ඇත. එසේ ගණනය කිරීමෙන් පසු එම ණය හා ලැබිය යුතු දෑ සඳහා සළුල පොලී අනුපාතයට අනුව ක්‍රමක්ෂය ගණනය කර අපහායනය අඩු කර මූල්‍ය වාර්තාවල පෙන්නුම් කරනු ලැබේ.

8.0 සේවක විශ්‍රාමික ප්‍රතිලාභ

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික දීමනා

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම නිර්වචිත දායකත්ව සැලසුම මෙන් නොව පසු සේවක ප්‍රතිලාභයන් සඳහා සැලසුම් කර ඇත. ආයතනයේ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම යටතේ පාරිතෝෂික දීමනා සැලසුම ශුද්ධ වගකීම වාර්ෂික ආයුගණක ක්‍රමය උපයෝගී කර ගෙන ගණනය කර පෙන්නුම් කර ඇත. ආයතනයේ සියළුම සේවකයින් සඳහා ඔවුන්ගේ විශ්‍රාමික පාරිතෝෂික දීමනා ඔවුන් සේවයෙන් විශ්‍රාම ගැනෙන අවස්ථාව දක්වා ආවරණය වන පරිදි සැලසුම පිළියෙල කර පිරිවැය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් කර ඇත. ආයුගණක කිරීමෙන් පසු ලාභය හෝ පාඩුව ආදායමක් හෝ වියදමක් ලෙස වාර්තාකරන වර්ෂයේ දී ම හඳුනා ගැනේ.

වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල පාරිතෝෂික දීමනා මුදල ජංගම වගකීම් යටතේ පෙන්නුම් කර ඇත. මුළු පාරිභෝගික දීමනා ප්‍රමාණය හා සමාන අගයක් ලංකා බැංකුවේ තැන්පතු ගිණුම්වල ගෙවීම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් ආයෝජනය කර ඇත.

නිර්වචිත දායකත්ව සැලසුම - සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

නිර්වචිත දායකත්ව සැලසුම යටතේ ආයතනය ස්ථාවර දායක මුදලක් සියලු සේවකයින් සඳහා යොදනු ලැබේ. මූලික වැටුපට හා ජීවන වියදම් දීමනා අගයන්හි එකතුව මෙම ගණනය සඳහා උපයෝගී කර ගන්නා අතර ආයතනය විසින් 12% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහාද 3% ක් සේවක භාරකාර අරමුදල සඳහා ද බැර කෙරේ.

9.0 **ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන**

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ට අනුව ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කරන අතර ඒ අනුව **2016** සිට මූල්‍ය ප්‍රකාශන සඳහා එම ප්‍රමිතියට අනුව අනුගත කර ඇත. මෙම ප්‍රමිතයට අනුව ප්‍රාග්ධන ප්‍රදානයන් ආයතනයේ ආදායමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලැබේ

10.0 <u>කෙටි කාලීන වෙන් කිරීම් සහ අසම්භාව්‍යන්</u>

10.1 අසම්භාව්‍ය වගකීම්

විය හැකි හෝ වර්තමානයේ සිදුවිය හැකි වගකීමක් මේ සඳහා මතු නොවීම හේතුවෙන් මූල්‍ය සම්පත් ගලා යාමක් ඇති සිදු නොවීමේ හේතුව මත **2020** වර්ෂයේ මේ සඳහා කිසිදු වෙන් කිරීමක් සිදු කර නොමැත.

10.2 අඩමාන ණය සඳහා වෙන් කිරීම

වර්ෂය අවසාන වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය මත **6%** ක අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කරනු ලැබේ. සටහන් අංක **47** මඟින් ණය අත්තිකාරම් සහ අනෙකුත් කාලීන තැන්පතු සඳහා මූල්‍ය අවධානම පිළිබඳව අතිරේක තොරතුරු ඉදිරිපත් කර ඇත.

11.0 <u>ආදායම් හඳුනා ගැනීම</u>

පුහුණු ආදායම

11.1 කෙටි කාලීන වැඩසටහන්

පුහුණු කාල සීමාව මාස **06** කට වඩා අඩු නම් එම වැඩ සටහන කෙටි කාලීන වැඩසටහනක් ලෙස වර්ග කරන අතර පුහුණු වැඩසටහන ආරම්භක වර්ෂයේ දී ම මෙහි මුළු ආදායම හා වියදම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

11.2 දිගු කාලීන පුහුණු වැඩසටහන් **(ඉදිරියට යන වැඩසටහන්)**

පුහුණු කාල සීමාව මාස **06** ට වඩා වැඩි වන්නේ නම් එම වැඩසටහන් දිගු කාලීන වැඩසටහන් **(ඉදිරියට යන වැඩසටහන්)** ලෙස සලකනු ලැබේ. මෙහි පුහුණු වැඩසටහන්වල ආරම්භක මාසය හා පාඨමාලා කාල සීමාව සැලකිල්ලට ගෙන සමානුපාතික පදනම උපයෝගී කර ගෙන ආදායම් හා වියදම් කාලීන පදනම මත ගිණුම් ගත කෙරේ.

11.3 බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය

බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් සහ වියදම වෙන වෙනම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්නුම් කර ඇත.

11.4 වෙනත් ආයතන වෙත පහසුකම් කුලියට ලබා දීම

ආයතනය ආදායම් ඉපයීම සඳහා එහි පහසුකම් වෙනත් ආයතනයන්ගේ පුහුණු අවශ්‍යතා සඳහා ලබා දෙනු ලැබේ. ආයතනයේ ප්‍රමුඛ පරමාර්ථයට පරිහානිරව වෙනත් ව්‍යාපෘතියක් හේතුවෙන් මෙහි ආදායම් හා වියදම් වෙන වෙනම මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ වාර්තා ඇතුළත් කර ඇත.

11.5 රජයේ ප්‍රදාන

ජාතික අයවැය දෙපාර්තමේන්තුව වාර්ෂික අයවැය මඟින් සැලකිය යුතු මුදලක් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වෙනුවෙන් ප්‍රදානය කරන අතර, එම ප්‍රදානයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 ට අනුව ගිණුම් ගත කර ඇත.

12.0 <u>වාර්තාකරණ දිනට පසු සිදුවන සිදු වීම</u>

මූල්‍ය වාර්තා නිකුත් කිරීමට අනුමත කරන දිනය හා වාර්තා කරන අවසාන දිනය අතරතුර සිදුවන හිතකර හා අහිතකර සිදුවීම් වාර්තාකරණ දිනයට පසු සිදුවීම් ලෙස සලකනු ලැබේ. සිදුවන සිදුවීමේ වටිනාකමේ ස්වභාවය මත මෙම සිදුවීම් හෙළිදරව් කළ යුතු හෝ ගැලපිය යුතු කරුණු ලෙස අවශ්‍යතාව අනුව මූල්‍ය වාර්තාවල වාර්තා කරනු ලැබේ.

ගැලපිය යුතු අවස්ථා

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ කළ දිනට පසුව වෙනත් ද්‍රව්‍යමය සිදු වීම් කිසිවක් සිදු නොවීම හේතුවෙන් වෙනත් ගැලපිලි සටහනක අවශ්‍යතාවක් ඇති වී නොමැත.

හෙළිදරව් කළ යුතු අවස්ථා

- **VAT** ලියාපදිංචිය නිෂ්ක්‍රීය කිරීම
  දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් **2020.01.01** දින සිට බල පැවැත්වෙන පරිදි වගකීම් පිරිවැටුම අදාළ සීමාව ඉක්මවා නොයාම හේතුවෙන් **VAT** බදු අක්‍රීය කර ඇත.

- නව සංවර්ධන ව්‍යාපෘතිය
  ආයතනයේ පුහුණු පහසුකම් උපාධි පිරිනමන ආයතනයක් දක්වා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පවතී. දේශණ ශාලා සහිත පර්යේෂණ හා පුහුණු ඒකක සහිත නව ගොඩනැගිල්ල ඉදි කිරීමේ මුල් අදියර **2020** වසරේ දී අවසන් වූ අතර එහි දෙවන

අදියර **2021** වසරේදී ආරම්භ කිරීමට නියමිත ය. ඊට සමගාමීව උපාධි පාඨමාලා තුනක් සඳහා විෂය මාලා සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

13.0 ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සකස් කිරීම

2019.01.01 සිට නේවාසිකාගාරයේ මුළුතැන්ගෙයි උපකරණ හා පිඟන් භාණ්ඩ හා රෙදිමය අයිතම පාරිභෝජන ද්‍රව්‍ය සේ සලකා ගිණුම්ගත කිරීම සිදු කරන අතර වර්ෂය අවසානයේ හඳුනා ගන්නා ලද පළුදු වීම හා අපහායනයන් පාරිභෝජන පිරිවැය යටතේ ගිණුම්ගත කරනු ලැබේ.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (රුපියල්)

දෙසැම්බර් 31 දිනට

වත්කම්	සටහන්	2020 (රු.පි.)	2019 (රු.පි.)
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	14	18,557,323.03	4,792,291.33
ලැබිය යුතු දෑ	15	19,678,719.31	23,101,346.33
තොගයන්	16	4,588,910.10	3,967,720.14
කලින් ගෙවීම්	17	21,257,750.53	22,810,766.76
වෙනත් ජංගම වත්කම්	**18**	207,936,454.12	192,466,222.03
		272,019,157.09	**247,138,346.59**
ජංගම නොවන වත්කම්			
ලැබිය යුතු දෑ	19	2,034,328.11	2,257,069.74
දේපල, පිරියත හා උපකරණ	20	502,498,844.17	513,976,390.62
අස්පෘශ්‍ය වත්කම්	21	1,326,816.21	1,601,904.44
ජංගම නොවන වෙනත් වත්කම්	22	200,267,626.69	108,591,969.09
		706,127,615.18	**626,427,333.89**
මුළු වත්කම්		**978,146,772.27**	**873,565,680.48**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	23	27,186,456.42	20,051,592.74
කෙටි කාලීන ප්‍රතිපාදන	24	357,110.00	547,110.00
සේවක ප්‍රතිලාභ	25	571,010.00	762,691.03
		28,114,576.42	**21,361,393.77**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	26	9,250,014.91	8,192,410.74
ආපසු ගෙවන ආරක්ෂිත තැන්පතු	27	96,332.93	101,129.87
මුළු ජංගම නොවන වගකීම්		**9,346,347.84**	**8,293,540.61**
මුළු වගකීම්		**37,460,924.26**	**29,654,934.38**
ශුද්ධ වත්කම්		**940,685,848.01**	**843,910,746.10**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			

රජය දායක වූ ප්‍රාග්ධනය හා වෙනත් රාජ්‍ය ආයතන	28	35,490,371.21	35,490,371.21
සංචිතයන්	29	416,311,660.77	416,311,660.77
සමුච්චිත අතිරික්තය / (ඌණතාවය)	30	488,883,816.03	392,108,714.12
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		**940,685,848.01**	**843,910,746.10**

පිටු අංක **47** සිට **57** දක්වා සහ **60** සිට **88** දක්වා සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංඝටනීය කොටසක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇති බවට සහතික කරමු.

ආචාර්ය කේ. එච්. ජී. එම්. ප්‍රසාද් ධර්මසේන
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

එල්. ඩී. ජේ. ප්‍රියන්ත
ගණකාධිකාරී

මෙම ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටින අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඒ. එල්. ඒ. අසෝක සිරිවර්ධන
සභාපති
2021.03.26

අරුණි එස්. රණසිංහ
පාලක මණ්ඩල සාමාජික
අතිරේක ලේකම්
වැවිලි අමාත්‍යාංශය

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය (රුපි.)

දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම	සටහන්	2019 (රුපී:)	2018 (රුපී:)
රජයේ පුනරාවර්තන ප්‍රදාන	31	57,811,000.00	54,000,000.00
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ආදායම	32	25,750,000.00	21,000,000.00
විශේෂ ව්‍යාපෘතියෙන් ලද ආදායම - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	33	80,817,396.60	60,782,603.40
පුහුණු ආදායම්	34	23,747,526.82	69,292,106.32
නේවාසික පහසුකම් කුලියට දීම තුළින් ලද ආදායම්	35	6,365,758.03	20,368,591.95
පොලී ආදායම්	36	14,744,742.56	17,465,493.03
වෙනත් ආදායම්	37	1,105,182.27	1,721,091.18
මුළු ආදායම		**210,341,606.28**	**244,629,885.88**
වියදම්			
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	38	45,139,623.93	43,417,746.30
සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය භාවිතය	39	4,114,293.09	5,013,920.48
නඩත්තු සහ අළුත්වැඩියා	40	8,894,540.43	7,137,163.37
සන්නිවේදන සහ උපයෝගීතා සේවා	41	12,405,928.82	13,161,884.26
පුහුණු වියදම් ධාරිතා සංවර්ධන වැඩසටහන් ද ඇතුළුව	42	11,349,815.35	32,392,533.77
නේවාසික පහසුකම් කුලියට දීම සඳහා වූ වියදම්	43	2,149,739.51	8,029,320.95
බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම්	44	1,864,514.71	2,888,019.69
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	45	26,658,934.23	25,136,857.21
වෙනත් වියදම්	46	948,348.50	1,642,796.45
මුළු වියදම්		**113,525,738.57**	**138,820,242.48**
කාල සීමාවට අදාළ අතිරික්තය / (ඌණතාවය)		96,815,867.71	105,809,643.40
පාලන අස්තිත්වයේ හිමිකාරිත්වයට අදාළ කොටස		**96,815,867.71**	**105,809,643.40**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය (රුපි.)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් සිදු වූ මුදල් ප්‍රවාහයන්	31/12/2020	31/12/2019
	(රුපි.)	(රුපි.)
වර්ෂය සඳහා අතිරික්තය (හිඟය)	96,815,867.71	105,809,643.40
අඩු කලා පොලී ආදායම	14,662,364.15	17,215,138.43
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	82,153,503.56	88,594,504.97
මුදල් නොවන සංචලනයන්		
ක්ෂය	26,135,846.00	24,677,970.21
ක්‍රමක්ෂය	523,088.23	458,887.00
විශ්‍රාමික පාරිතෝෂික සඳහා (අධි)/ඌණ වෙන් කිරීම්	865,923.14	(2,438,467.54)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද (ලාභ)/ අලාභ	20,098.82	45,648.18
රෙදි සහ හැඳි ගෑරුප්පු පාරිභෝජන තොග සඳහා මාරු කිරීම	27,278,139.87	805,772.70
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්	(106,567,396.60)	(81,782,603.40)
අඩමාණ ණය (අධි)/ඌණ වෙන් කිරීම	(215,740.06)	914,544.56
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම්) / අඩුවීම්	3,595,667.76	(15,242,409.40)
තොගයන්හි (වැඩිවීම්) / අඩුවීම්	(621,189.96)	(2,212,791.92)
කලින් ගෙවුම් හි (වැඩිවීම්) / අඩුවීම්	1,553,016.23	(9,733,724.54)
අනෙකුත් ජංගම වත්කම් හි (වැඩිවීම්) / අඩුවීම්	(16,455,054.02)	24,122.25
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි වැඩිවීම් / (අඩුවීම්)	7,134,863.68	(2,051,537.80)
මූල්‍යමය උපකරණ වල ක්‍රමක්ෂය (ලාභ)/අලාභ	(82,378.41)	(250,354.60)
සේවක රක්ෂිත තැන්පතු වැඩිවීම් / (අඩුවීම්)	(4,796.94)	(24,122.25)
කෙට් කාලීන වෙන් කිරීම් වැඩිවීම් / (අඩුවීම්)	(190,000.00)	547,110.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(57,029,912.26)**	**(86,261,956.55)**
ආයෝජන ක්‍රියාකාරකම්		
දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම	(41,997,304.04)	(31,979,265.04)
අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	(248,000.00)	(1,249,150.00)

ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල්		-
කෙට් කාලින තැන්පතු වල ආයෝජනය කිරීම	(177,578,156.99)	(17,691,536.65)
තැන්පතු මුදල් බවට පත් කිරීම	176,324,094.59	-
ණය අත්තිකාරම් ගෙවීම	(2,608,000.00)	(3,544,140.00)
ණය හා අත්තිකාරම් ලැබීම්	2,955,819.36	3,422,054.49
පොලී ආදායම් ලැබීම්	16,901,248.48	18,191,197.57
නව ගොඩනැගිල්ල සහ ඉගෙනුම් මධ්‍යස්ථානය වෙනුවෙන් ආයෝජනය කිරීම	(91,675,657.60)	(59,974,127.48)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(117,925,956.20)**	**(92,824,967.11)**
මූල්‍ය ක්‍රියාකාරකම්		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන්	25,750,000.00	21,000,000.00
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රදානයන්	80,817,396.60	60,782,603.40
මහා භාණ්ඩාගාරය වෙත කළ ගෙවීම්	-	-
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් වූ ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**106,567,396.60**	**81,782,603.40**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)	**13,765,031.70**	**(8,709,815.29)**
මුදල් හා මුදල් සමාන දෑ හී වර්ෂ ආරම්භක ශේෂය	**4,792,291.33**	**13,502,106.62**
මුදල් හා මුදල් සමාන දෑ හී වර්ෂ අවසාන ශේෂය සටහන් 14	**18,557,323.03**	**4,792,291.33**

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය				
ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය				
2020 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා				
ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය				
විස්තරය	දායක වූ ප්‍රාග්ධන	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවා ගත් සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය)	මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය
2017 දෙසැම්බර් **31** දිනට ශේෂය	**35,490,371.21**	**135,710,198.08**	**61,611,956.59**	**232,812,525.88**
රඳවා ගත් ලාභ ගිණුමට මාරු කිරීම	-	(5,302,499.00)	5,302,499.00	-
2018 ප්‍රත්‍යාගණන ලාභය	-	-	152,887,210.63	152,887,210.63
මහා භාණ්ඩාගාරය වෙත නැවත යොමු කළ මුදල	-	-	66,497,404.50	66,497,404.50
2018 වසරේ ලාභය	**35,490,371.21**	**130,407,699.08**	**286,299,070.72**	**452,197,141.01**
ප්‍රත්‍යාගණන ඉඩම	-	285,903,961.69	-	285,903,961.69
2020 වසරේ ලාභය	-	-	105,809,643.40	105,809,643.40
2020.12.31 දිනට ශේෂය	**35,490,371.21**	**416,311,660.77**	**392,108,714.11**	**843,910,746.10**
ගැලපීම් - පහත සටහන බලන්න			**(40,765.80)**	**(40,765.80)**
2020 වසරේ ලාභය			**96,815,867.71**	**96,815,867.71**
2020.12.31 දිනට ශේෂය	**35,490,371.21**	**416,311,660.77**	**488,883,816.03**	**940,685,848.01**

විස්තරය	හර	බැර
වතුර ටැංකි අළුත්වැඩියා කටයුතු සඳහා වියදම ගොඩනැගිලි ගිණුමෙන් පුනරාවර්තන ගිණුමට මාරු කරන ලදී	273,699.80	-
ඉහත මාරු කිරීම් මඟින් ඇති වන ක්ෂය	-	12,223.00
ලී බඩු ක්ෂය වියදම් (බගවන්තලාව)	-	63,911.00
ගොඩනැගිලි ගිණුමෙන් වැඩිපුර අය කළ ක්ෂය උපකරණ ගිණුමට වැය කිරීම රු. 3,136,000/-@5%		156,800.00
එකතුව	**273,699.80**	**232,934.00**
		40,765.80

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

අයවැය සහ සත්‍ය කාර්ය සාධනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (රු. 000)

ආදායම්		සත්‍ය (රු: දහස්)	අයවැය (රු: දහස්)	ප්‍රගතිය
රජයේ පුනරාවර්තන ප්‍රදාන	30	57,811	60,000	96%
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ආදායම	31	25,750	29,750	87%
විශේෂ ව්‍යාපෘති ප්‍රදාන (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය)	32	80,817	80,817	100%
පුහුණු ආදායම්	33	23,748	39,854	60%
නේවාසික පහසුකම් කුලියට දීම	34	6,366	8,440	75%
පොලී ආදායම්	35	14,745	16,860	87%
වෙනත් ආදායම්	36	1,105	1,022	108%
මුළු ආදායම්		**210,342**	**236,743**	**89%**
පුනරාවර්තන වියදම්				
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	37	45,140	49,402	91%
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය භාවිතයන්	38	4,114	5,511	75%
නඩත්තු සහ අලුත්වැඩියා	39	8,895	9,817	91%
සන්නිවේදන සහ උපයෝගීතා සේවා	40	12,406	15,843	78%
ධාරිතා සංවර්ධන පිරිවැය සමඟ පුහුණු වියදම්	41	11,350	22,901	50%
පහසුකම් කුලියට දීම සම්බන්ධ වියදම්	42	2,150	3,055	70%
බඟවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම්	43	1,865	3,000	62%
ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	44	26,659	26,000	103%
වෙනත් වියදම්	46	948	1,118	85%
මුළු වියදම්		**113,526**	**136,647**	**83%**
ප්‍රාග්ධන වියදම්				
දේපල පිරියත හා උපකරණ		26,384	41,856	63%
විශේෂ ව්‍යාපෘති - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය		91,676	123,317	74%
මුළු ප්‍රාග්ධන වියදම්		**118,060**	**165,173**	**71%**
මුළු වියදම්		**231,585**	**301,820**	**77%**
භණ්ඩාගාර ප්‍රදාන				
පුනරාවර්තන වියදම්		57,811	60,000	96%
ප්‍රාග්ධන වියදම්		25,750	29,750	87%
අමාත්‍යාංශ විශේෂ ව්‍යාපෘති ප්‍රදානයන්		80,817	80,817	100%
මුළු ප්‍රදාන		**164,378**	**170,567**	**96%**

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය								
දේපල පිරියත හා උපකරණ ලේඛනය								
විස්තරය	ඉඩම්	ගොඩනැඟිලි	උපකරණ	ලී බඩු	වාහන	යටිතල පහසුකම් වත්කම්	පුස්තකාල පොත්	එකතුව
පිරිවැය								
2019/01/01 දිනට	1,096,038.31	199,670,457.38	28,325,373.82	14,188,518.82	33,965,100.00	19,566,901.24	3,090,168.56	299,902,558.13
එකතු කිරීම්	-	24,415,839.77	4,199,662.64	1,059,672.70	1,400,740.00	420,978.00	482,371.93	31,979,265.04
මාරු කිරීම්	-		(1,365,392.10)		-		-	(1,365,392.10)
ප්‍රත්‍යාගණනය	285,903,961.69							285,903,961.69
ඉවත් කිරීම්	-	-	(235,138.00)	(114,017.86)			-	(349,155.86)
2019/12/31 දිනට	**287,000,000.00**	**224,086,297.15**	**30,924,506.36**	**15,134,173.66**	**35,365,840.00**	**19,987,879.24**	**3,572,540.49**	**616,071,236.90**
එකතු කිරීම්		12,460,188.41	22,090,476.38	3,999,066.50		1,419,387.40	2,028,185.35	41,997,304.04
මාරු කිරීම්		(27,551,839.67)	(277,169.00)	277,169.00				(27,551,839.67)
ප්‍රත්‍යාගණනය	-							-
ඉවත් කිරීම්			(65,125.70)	(64,699.50)				(129,825.20)
2020/12/31 දිනට	**287,000,000.00**	**208,994,645.89**	**52,672,688.04**	**19,345,709.66**	**35,365,840.00**	**21,407,266.64**	**5,600,725.84**	**630,386,876.07**

		ක්ෂය වීම්						
සමුච්චිත ක්ෂය 2019/01/01 දිනට	-	37,669,556.70	14,799,417.07	4,311,554.44	10,098,298.05	9,202,736.34	2,198,440.55	78,280,003.15

ක්ෂය පිරිවැය	-	9,995,745.63	4,294,365.31	1,494,068.95	6,832,160.40	1,881,313.17	180,316.75	24,677,970.21
ඉවත් කිරීම්		-	(235,138.00)	(68,369.68)				(303,507.68)
ප්‍රත්‍යාගණන ගැලපීම්	-	-						-
මාරු කිරීම්	-	-	(559,619.40)				-	(559,619.40)
සමුච්චිත ක්ෂය 2019/12/31 දිනට	**-**	**47,665,302.33**	**18,299,024.98**	**5,737,253.71**	**16,930,458.45**	**11,084,049.51**	**2,378,757.30**	**102,094,846.28**
ක්ෂය පිරිවැය	-	9,995,703.50	5,503,381.61	1,556,797.32	7,073,165.40	1,881,313.17	125,485.00	26,135,846.00
ඉවත් කිරීම්	-		(65,054.00)	(44,672.38)		-	-	(109,726.38)
ප්‍රත්‍යාගණන ගැලපිලි	-	-					-	-
මාරු කිරීම්	-	(169,023.00)	(277,169.00)	213,258.00		-		(232,934.00)
සමුච්චිත ක්ෂය 2020/12/31 දිනට	**-**	**57,491,982.83**	**23,460,183.59**	**7,462,636.65**	**24,003,623.85**	**12,965,362.68**	**2,504,242.30**	**127,888,031.90**
2019/12/31 දිනට ශුද්ධ පොත් අගය	**287,000,000.00**	**176,420,994.82**	**12,625,481.38**	**9,396,919.95**	**18,435,381.55**	**8,903,829.73**	**1,193,783.19**	**513,976,390.62**
2020/12/31 දිනට ශුද්ධ පොත් අගය	**287,000,000.00**	**151,502,663.06**	**29,212,504.45**	**11,883,073.01**	**11,362,216.15**	**8,441,903.96**	**3,096,483.54**	**502,498,844.17**

අස්පෘශ්‍ය වත්කම්								
	ගිණුම්කරණ පරිගණක මෘදුකාංගය	පුහුණු පාඨමාලා සංවර්ධන ක්‍රම පිරිවැය	පරිගණක දත්ත සැකසුම් පද්ධතිය	වත්කම් කළමනාකරණ මෘදුකාංගය	වෙබ් අඩවි නිර්මාණය හා සංවර්ධනය	GIS මෘදුකාංගය	තේමා ගීතය	එකතුව
2019/01/01 දිනට පිරිවැය	**209,500.00**	**2,086,989.79**	**240,000.00**	**800,000.00**	**-**	**-**	**-**	**3,336,489.79**
නව අත්පත් කර ගැනීම්	300,000.00				270,000.00	339,150.00	340,000.00	1,249,150.00
2019.12.31 දිනට පිරිවැය	**509,500.00**	**2,086,989.79**	**240,000.00**	**800,000.00**	**270,000.00**	**339,150.00**	**340,000.00**	**4,585,639.79**
ගැලපීම්								
නව අත්පත් කර ගැනීම්	-		248,000.00		-	-		248,000.00
2020.12.31 දිනට පිරිවැය	**509,500.00**	**2,086,989.79**	**488,000.00**	**800,000.00**	**270,000.00**	**339,150.00**	**340,000.00**	**4,833,639.79**
2019.01.01 දිනට ක්‍රමක්ෂය	209,490.00	1,541,055.00	239,990.00	534,313.35	-	-	-	2,524,848.35
ගැලපීම								-
ක්‍රමක්ෂය	-	351,122.00	-	75,000.00	16,273.00	16,492.00	-	458,887.00
2019.12.31 දිනට ශේෂය	**209,490.00**	**1,892,177.00**	**239,990.00**	**609,313.35**	**16,273.00**	**16,492.00**	**-**	**2,983,735.35**
ක්‍රමක්ෂය	75,000.00	194,811.79	25,988.94	75,000.00	67,500.00	84,787.50	-	523,088.23
අපහායනයන්								
2020.12.31 දිනට	**284,490.00**	**2,086,988.79**	**265,978.94**	**684,313.35**	**83,773.00**	**101,279.50**	**-**	**3,506,823.58**
ශුද්ධ උපලබ්ධි අගය 2019.12.31 දිනට	300,010.00	194,812.79	10.00	190,686.65	253,727.00	322,658.00	340,000.00	1,601,904.44
ශුද්ධ උපලබ්ධි අගය 2020.12.31 දිනට	**225,010.00**	**1.00**	**222,021.06**	**115,686.65**	**186,227.00**	**237,870.50**	**340,000.00**	**1,326,816.21**

		2020	2019
14	මුදල් හා මුදල් සමාන දෑ	(රු.)	(රු.)
	ජංගම ගිණුම - ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව - 3697566	3,557,323.03	3,077,291.33
	ඉල්ලුම් තැන්පතු ගිණුම - ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව - 8693502	15,000,000.00	1,715,000.00
		18,557,323.03	**4,792,291.33**

15	ලැබිය යුතු දෑ (කෙටි කාලීන)		

15 (අ)	වෙළඳ ලැබිය යුතු දෑ		
	බගවන්තලාව තේ වතු සමාගම	98,500.00	98,500.00
	මධ්‍යම පරිසර අධිකාරිය	18,976.00	191,130.00
	චානක වීරකෝන් මයා	-	15,000.00
	පොල් වගා කිරීමේ මණ්ඩලය	18,000.00	
	පොල් සංවර්ධන අධිකාරිය	164,502.50	
	පොල් පර්යේෂණ ආයතනය	16,000.00	45,000.00
	පාඨමාලා ගාස්තු	2,343,999.50	1,495,000.00
	වනජීවී දෙපාර්තමේන්තුව	634,172.00	
	ධනුෂ්ක ජයසූරිය මයා	-	3,500.00
	ඇල්කඩුව වැව්ලි සමාගම	58,000.00	58,000.00
	ඇල්පිටිය වැව්ලි සමාගම	655,000.00	825,000.00
	හපුගස්තෙන්න වැව්ලි සමාගම	20,000.00	93,000.00
	හැටන් වැව්ලි සමාගම	2,000.00	10,000.00
	මධ්‍යම ඉංජිනේරු උපදේශණ සේවා (පුද්ගලික) සමාගම	201,961.29	-
	වාරිමාර්ග අමාත්‍යාංශය	-	191,632.00
	ජනතා වතු සංවර්ධන මණ්ඩලය	56,000.00	71,000.00
	කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව	65,000.00	110,000.00
	කුරුණෑගල වැව්ලි සමාගම	2,000.00	-
	ලලාන් රබර් සමාගම	22,000.00	-

	මඩොල්සිමා වැව්ලි සමාගම	-	140,000.00
	මස්කෙලිය වැව්ලි සමාගම	12,000.00	32,000.00
	මතුරට වැව්ලි සමාගම	270,000.00	270,000.00
	අධ්‍යාපන අමාත්‍යාංශය	13,488,810.32	14,934,727.00
	වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය	-	387,755.80
	වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය - PMMD	8,000.00	-
	මොරවක්කෝරලේ තේ නිපදවන්නන්ගේ සමිතිය	-	-
	ඒ.එල්.එස්. සම්පත් මයා	12,000.00	-
	බී.බී.එන්. මාරසිංහ මයා	45,000.00	-
	සී.ටී. මතුගම මයා	45,000.00	-
	එම්.පී. අමරසිංහ මයා	4,072.30	4,072.30
	නමුණුකුල වැව්ලි සමාගම	2,000.00	-
	ජාතික සංවර්ධන ව්‍යාපාර අධිකාරිය	6,000.00	-
	ජාතික මැතිවරණ කොමිෂන් සභාව	-	8,797.50
	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය	52,115.00	-
	ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය	-	676,981.40
	නිෂාමිණි ඉලංගන්තිලක මිය	-	285.00
	වැව්ලි නිවාස සංවර්ධන භාරය	-	5,310.00
	පුස්සැල්ලාව වැව්ලි සමාගම	-	30,000.00
	බතික් රාජ්‍ය අමාත්‍යාංශය	41,992.50	-
	ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය	-	74,198.17
	තේ මණ්ඩලය	-	2,215,165.92
	උක් පර්යේෂණ ආයතනය	2,000.00	-
	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	272,200.00	-
	තලවකැලේ තේ වතු යාය	2,000.00	215,000.00
	උඩපුස්සැල්ලාව වැව්ලි සමාගම	-	45,000.00

	එල්.ඩී.ජේ. ප්‍රියන්ත මයා	1,584.71	-
	රුවිනි ලොකුහෙට්ටි මිය	3,332.67	-
	කීර්ති සරත් කුමාර මයා	549.86	-
	යූ.ජී.එම්.එන්. ලක්මාලි මිය	5,604.00	-
	බී.බී. සෙව්වන්දි මිය	14.68	-
	වයඹ විශ්ව විද්‍යාලය	2,075.00	2,075.00
	මුළු ණයගැතියන්	**18,652,462.33**	**22,248,130.09**
	අඩු කලා - අඩමාණ ණය වෙන් කිරීම	1,119,147.74	1,334,887.80
	ශුද්ධ මුළු වෙලඳ ලැබිය යුතු දෑ	**17,533,314.59**	**20,913,242.29**

15(අා)	සේවක අත්තිකාරම් සහ ණය		
	ආපදා ණය	2,135,904.72	2,177,354.04
	උත්සව ණය	7,500.00	8,750.00
	විශේෂ අත්තිකාරම්	2,000.00	2,000.00
	මුළු සේවක අත්තිකාරම් සහ ණය	**2,145,404.72**	**2,188,104.04**
	වර්ෂයේ ආරම්භක ශේෂය	**4,605,833.85**	**4,483,748.34**
	සේවක ණය නිකුත් කිරීම	2,608,000.00	3,544,140.00
	සේවක ණය නැවත ගෙවීම්	(2,955,819.36)	(3,422,054.49)
	වසර අවසානයේදී ශේෂය	**4,258,014.49**	**4,605,833.85**
	කෙටි කාලීන ණය සහ අත්තිකාරම්	2,145,404.72	2,188,104.04
	දිගු කාලීන ණය සහ අත්තිකාරම්	2,112,609.77	2,417,729.81
(ඇ)	වෛද්‍යාධාර යෝජනා ක්‍රමයෙන් ලැබිය යුතු මුදල		
	කෙටි කාලීන මුළු ලැබීම්	**19,678,719.31**	**23,101,346.33**

16	තොගයන්		
	ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	527,295.30	523,125.00

	මුද්‍රණ උපකරණ	1,291,720.00	1,094,998.00
	නඩත්තු උපකරණ	232,340.00	86,305.00
	ටයර් සහ ටියුබ්	-	-
	සුභ සාධන උපකරණ	35,839.00	55,026.00
	පාරිභෝජන ද්‍රව්‍ය	128,081.80	71,381.60
	වියළි ආහාර ද්‍රව්‍ය	-	3,836.00
	ආයතන ප්‍රකාශනයන්	819,850.00	835,700.00
	රෙදි	1,265,947.50	1,062,573.27
	හැඳි ගෑරුප්පු	219,444.00	234,775.27
	විද්‍යාගාර උපකරණ	68,392.50	-
	මුළු තොගයන්	**4,588,910.10**	**3,967,720.14**

17			කලින් ගෙවීම්
	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (වාර්ෂික බලපත්‍ර)	48,192.68	37,235.72
	මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්ගලික ආයතනය	21,292.00	18,809.60
	IDAC පුද්ගලික ආයතනය	15,150.00	10,062.51
	ගෙස්ටෙටිනර් සිලෝන් පුද්ගලික ආයතනය	9,960.00	7,875.17
	සී. බී. ඒ. පුද්ගලික ආයතනය - සේවා ගිවිසුම	6,022.66	4,130.25
	ජෝන් කීල්ස් පුද්ගලික ආයතනය - සේවා ගිවිසුම	31,396.98	-
	බිස්නස් මැෂින් පුද්ගලික සමාගම - සේවා ගිවිසුම	14,864.00	-
	ජාතික රක්ෂණ අරමුදල - ගිනි රක්ෂණය	7,740.88	8,282.21
	ජාතික රක්ෂණ අරමුදල - වාහන රක්ෂණය	302,637.92	97,499.40
	ජාතික රක්ෂණ අරමුදල - වෛද්‍ය රක්ෂණය	-	2,531,220.00
	අලියාන්ස් රක්ෂණ සමාගම - වෛද්‍ය රක්ෂණය	707,413.00	-
